**(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)**

**අංක 7(3).]**

# පාර්ලිමේන්තුවේ අංක 7 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2017 සැප්තැම්බර් මස 22 වැනි සිකුරාදා**

---

## 2017 ඔක්තෝබර් මස 03 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## 2017 ඔක්තෝබර් මස 09 වැනි සඳුදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

124/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ නගර තුළ යාචකයන් විශාල ප්‍රමාණයක් සිටින බවත්;

(ii) ඔවුන්ගෙන් සමහරක් විවිධ සමාජ විරෝධී කටයුතුවලට සම්බන්ධ බවත්;

(iii) ඇතැමුන් යාචක වෙස්ගත් වංචාකාරයන් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ සිටින යාචකයන් පිළිබඳව සංගණනයක් කර තිබේද; එසේ නම්, එම දිනය කවරේද;

(ii) එම සංගණනයට අනුව ශ්‍රී ලංකාව තුළ සිටින යාචකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සංඛ්‍යාව ගැහැණු, පිරිමි හා ළමුන් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) යාචකයන් පිළිබඳ සංගණනයක් කර නොමැති නම්, සංගණනයක් කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) යාචකයන් පුනරුත්ථාපනයට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාව තුළ ඇති යාචක පුනරුත්ථාපන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම පුනරුත්ථාපන කටයුතු සඳහා වසරකට රජය වැය කරන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1217/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළ වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1294/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නෛතික අයිතිය නොමැතිව මාතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම්වල මේ දක්වා පදිංචිව සිටින හෝ වගා කරමින් සිටින පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i) හි සඳහන් පුද්ගලයන් සංඛ්‍යාවෙන් කවර සංඛ්‍යාවකට ඔප්පු හෝ බලපත්‍ර ලබා දීමට පියවර ගෙන තිබේද;

(iv) ඉහත (iii) හි සඳහන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) 2014 හා 2015 වර්ෂයන්හි මාතර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් සඳහා පිරිනමා ඇති ඔප්පු හෝ බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(vi) ඉහත (v) හි සඳහන් සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1385/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 145 යෝජනාවට අනුව, ධීවර ප්‍රජාවගේ සුරක්ෂිතභාවය අරමුණු කර ගනිමින්, මුහුදේදී සිදුවන අනතුරු සඳහා රුපියල් මිලියනයක ජීවිත රක්ෂණ යෝජනා ක්‍රමයක් ආරම්භ කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම රක්ෂණ ආවරණය ලබාදෙන ආයතනය සහ ඒ වෙනුවෙන් ගෙවනු ලබන රක්ෂණ වාරිකයන් කවරේද;

(iii) මෙම රක්ෂණ යෝජනා ක්‍රමය මඟින් හානිපූරණය කළ ප්‍රමාණය කොපමණද;

(iv) මෙම රක්ෂණ යෝජනා ක්‍රමය අනුව, ජීවිත රක්ෂණ ආවරණය ලැබූ ධීවරයන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1470/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම ස්ථාපනය කරන ලද වර්ෂය කවරේද;

(ii) මිහින් ලංකා සමාගම ආරම්භක අරමුණු කවරේද;

(iii) මිහින් ලංකා සමාගම ස්ථාපිත කළ දින සිට අවසන් අධ්‍යක්ෂ මණ්ඩලය දක්වා එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටි පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් සහ ලැබූ වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මිහින් ලංකා ආරම්භයේ සිට ලැබූ අලාභය වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මිහින් ලංකා සමාගම ණය ලබාගත් හා ණය ගෙවීමට ඇති රාජ්‍ය ආයතන හා එම ණය ප්‍රමාණයන් කවරේද;

(vi) මිහින් ලංකා සමාගමේ අනාගතය සම්බන්ධයෙන් රජය ගැනීමට බලාපොරොත්තුවන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1623/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෙවනගල සීනි කර්මාන්තශාලාව පසුගිය වසර 10 තුළ ලබා ඇති ලාභය හෝ අලාභය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දැනට මෙම කර්මාන්තශාලාවේ සේවයේ නියුතු ස්ථිර හා අනියම් කාර්ය මණ්ඩලය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වසර කිහිපය තුළ මෙම කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම කර්මාන්තශාලාවෙන් මීට වඩා නිෂ්පාදනයක් ළඟා කර ගැනීම සඳහා සුදුසුකම්ලත් නිසි කළමනාකාරිත්වයක අවශ්‍යතාවය පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ වෙනුවෙන් ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1709/’17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ තේ-පොහොර සහනාධාරය ලබා දී ඇති ප්‍රදේශ සංඛ්‍යාව කොපමණද;

(ii) දිවයිනෙහි සියළු කුඩා තේ වතු හිමියන්ට තේ-පොහොර සහනාධාරය ලබා දීම සඳහා අවශ්‍ය කරන මුදල ඇස්තමේන්තු කර තිබේද;

(iii) වර්ෂ 2015 සහ 2016 තුළ රජය විසින් තේ-පොහොර සහනාධාරය සඳහා වැයකර ඇති මුදල වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ තේ-පොහොර සහනාධාරය ලබාදී ඇති සහ මෙතෙක් ලබා දී නොමැති කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දිවයිනෙහි සිටින තේ-පොහොර සහනාධාරය ලැබීමට සුදුසුකම් ඇති කුඩා තේ වතු හිමියන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් අතරින් 2015 සහ 2016 වර්ෂවලදී පොහොර සහනාධාරය ලැබූ සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1725/’17

ගරු කනක හේරත් මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2013 සිට 2016 දක්වා,

(i) මෙරටට ආනයනය කරන ලද තිරිඟු පිටි ප්‍රමාණය;

(ii) ඒ සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණය;

(iii) ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල තිරිඟු පිටි පරිභෝජනය;

එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2013 සහ 2014 වර්ෂවලදී මෙරටට පිටි ආනයනය කිරීම අඩු කිරීම සඳහා පියවර ගත් බව දන්නේද;

(ii) මේ වනවිට තිරිඟු පිටි ආනයනය සීමා කිරීමට රජය විසින් පියවර ගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1751/’17

ගරු ලකී ජයවර්ධන මහතා,— රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා මේ වනවිට පවත්වාගෙන යනු ලබන සිනමාශාලා කවරේද;

(ii) ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) එම සිනමාශාලාවල හිමිකරුවන් සහ ඒවා ආරම්භ කර ඇති දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයින පුරා පිහිටි සිනමාශාලා වර්ගීකරණයක් කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයටද;

(iii) එම සිනමාශාලා නියාමනය කරනු ලබන්නේ කවුරුන්ද;

(iv) ඉතා අඩු පහසුකම් සහිතව හා දුර්වල ක්‍රියාකාරීත්වයෙන් යුතුව පවත්වාගෙන යනු ලබන සිනමාශාලා තිබෙන බව දන්නේද;

(v) එසේ නම්, සිනමාශාලා විධිමත්ව පවත්වාගෙන යාම සඳහා, සිනමාශාලා නියාමනය කිරීමට විධිමත් ක්‍රමවේදයක් කඩිනමින් සකස් කරන්නේද;

(vi) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1788/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990.12.31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ රේඛීය අමාත්‍යාංශය සහ පළාත් සභා යටතේ ක්‍රියාත්මක වෙමින් තිබූ දෙමළ මාධ්‍ය මුස්ලිම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් හා ඒවා පිහිටා තිබූ ස්ථානයන් කවරේද;

(iii) එම පාසල් ආවරණය වන අධ්‍යාපන කලාප සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එම එක් එක් පාසල, රජයේ පාසලක් බවට ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍ර අංක හා දින සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1798/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අධිකරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් වාර්ෂිකව සිදුවන අපරාධ ගණයට අයත් වන සිද්ධීන් සංඛ්‍යාව කොපමණද;

(ii) අපරාධ නඩුවලදී අධිකරණ ක්‍රියාමාර්ගවලින් වරදකරුවන් වන පුද්ගලයන්ගේ ප්‍රතිශතය කොපමණද;

(iii) එම අගය ආසියාවේ අනිකුත් රටවල් සමඟ සසඳන විට ඉහළ අගයක් ගන්නේද;

(iv) එසේ නම්, ඒ සම්බන්ධයෙන් රජය යෝජනා කරන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1812/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර - බෙලිඅත්ත දුම්රිය මාර්ගයේ සංඥා පද්ධතිය සවිකිරීම සඳහා වැයවන මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය සිදුකරන සමාගම කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(iv) එසේ නම්, ඒ සඳහා ඉදිරිපත් වූ සමාගම් හා මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගන්නා ආකාරය කවරේද;

(vi) එම සංඥා සවිකිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් මිල ගණන් ඉදිරිපත්කර තිබුනේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1815/'17

ගරු බිමල් රත්නායක මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බුද්ධශාසන අමාත්‍යාංශය හා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව මඟින් විහාරස්ථානවලට මුදල් ලබාදීමේ ක්‍රියාවලියක් පවතින බවත්;

(ii) එසේ මුදල් ලබාදීමේදී තෝරාගත් විහාරස්ථානවලට පමණක් මුදල් ලබාදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙලෙස විහාරස්ථානවලට මුදල් ලබාදීමේ ක්‍රියාවලියක් පවතින්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1865/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීතොටමුල්ලට අමතරව, පළාත් පාලන අයතන මඟින් බැහැර කර මේ වනවිට නිර්මාණය වී ඇති කසළ කඳු කවරේද;

(ii) ඒවා අයත්වන පළාත් පාලන ආයතන කවරේද;

(iii) වර්තමානයේ මෙම කසළ කඳුවල ඇති කසළ ප්‍රමාණය කොපමණද;

(iv) මේවා අතර දැනට අවදානම් තත්ත්වයේ පවතින කසළ කඳු තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙවැනි කසළ කඳුවලට තවදුරටත් කසළ බැහැර කරමින් ඒවා වර්ධනය වීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා පළාත් පාලන අමාත්‍යාංශය යටතේ කිසියම් වැඩපිළිවෙළක් ආරම්භ කර තිබේද;

(iii) මේ සඳහා දේශීය හා විදේශීය වශයෙන් ආයෝජන ලබා ගැනීමේ වැඩසටහනක් තිබේද;

(iv) එසේ නම්, ඒවා කවරේද;

(v) මේ වනවිට යම් වැඩසටහනක් ආරම්භ කර තිබේ නම්, එහි ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1869/'17

ගරු නාමල් රාජපක්ෂ මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.02.26 වන දින ආරම්භ කරන ලද මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයෙහි (F.C.I.D) සේවයේ නියුතු මුළු කාර්ය මණ්ඩලය කොපමණද;

(ii) එහි මාණ්ඩලික ශ්‍රේණියට අදාළ තනතුරු කවරේද;

(iii) එම තනතුරු සඳහා පත්කර ඇති නිලධාරින්ගේ නම, ලිපිනය, දීමනා සහ අමතරව ගෙවන ලද විශේෂ දීමනා ඇතුළත් මුළු වැටුප වෙන් වෙන් වශයෙන් ඇතුළත් ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015.02.26 දින සිට මේ දක්වා පරීක්ෂණ කටයුතු සඳහා විදේශ සංචාරවලට සහභාගි කරවන ලද මුළු නිලධාරින් සංඛ්‍යාව, ඔවුන් සංචාරය කරන ලද විදේශ රටවල් සංඛ්‍යාව, විදේශ රටවල් සහ එම සංචාර සඳහා වැය කරන ලද මුළු මුදල කොපමණද;

(ii) ඒ සඳහා සහභාගි වූ නිලධාරින්ගේ නම, ලිපිනය, සංචාරය කළ විදේශ රට සහ එම සංචාර සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් ඇතුළත් ලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 නොවැම්බර් මස 10 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

157/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තර ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම වනාන්තරයන්හි නම් කවරේද;

(iii) එක් එක් වනාන්තරයෙහි විශාලත්වය වෙන් වෙන් වශයෙන් අක්කර කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) උක්ත වනාන්තරයන්හි සීමා මායිම් ලකුණු කර තිබේද;

(ii) එසේ නම්, එම සීමා නිර්ණය කරනු ලැබූ දිනය කවරේද;

(iii) නොඑසේ නම්, සීමා නිර්ණය කිරීමට පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අ(ii)හි සඳහන් වනාන්තර තුළ මේ වනවිට නිවාස, සංචාරක කර්මාන්තයට අදාළ හෝටල් හෝ වෙනත් ඉදිකිරීම් තිබේද;

(ii) එසේ නම්, එම ඉදිකිරීම් හේතුවෙන් වනාන්තරයට සිදු වන බලපෑම පිළිබඳව අධ්‍යයනයක් සිදු කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1223/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළව වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1387/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 142ට අනුව, කිරි නිෂ්පාදනය සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ එකවර ක්ෂය කිරීමේ දීමනාව ලබාගත් පාර්ශවයන් කවුරුන්ද;

(ii) එකවර ක්ෂය දීමනා වශයෙන්, එකී එක් එක් ආයතනයක් ලබා ගත් මූල්‍ය ප්‍රතිලාභයන් කොපමණද;

(iii) දේශීය කිරි නිෂ්පාදනය වර්ධනයට අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර ආනයනයේදී, 2015 ජනවාරි 01 දිනට පෙර හා 2015 ජනවාරි 01 දිනෙන් පසු ලබා දුන් ආනයන බදු අඩුකිරීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1475/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් නිදහස් බස් ගමන් බලපත්‍ර ලබා දී ඇති රාජ්‍ය සේවකයන් හා වෙනත් පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් සේවය කරන ආයතන හා පදිංචි දිස්ත්‍රික්ක කවරේද;

(iii) එම එක් එක් රාජ්‍ය ආයතනය විසින් ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මාසිකව ගෙවන මුදල් ප්‍රමාණය, එක් එක් ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම නිදහස් ගමන් බලපත්‍රය භාවිතා කරන මාර්ගවලට අදාළව බස්රථ ධාවනයට යොදවා ඇති ඩිපෝවලට එම මුදල සෘජුවම ලබාදීමට හැකි ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(v) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ නවතා තැබීමේදී හා ධාවනය කිරීමේදී හා වෙනත් සේවක ගැටලුවලදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මුනිවත රකින ප්‍රතිපත්තියක් අනුගමනය කරන බව දන්නේද;

(vi) එම සේවකයන්ගේ ගැටලු විසඳීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ දායකත්වය වැඩි වශයෙන් ලබා ගැනීමට ක්‍රියා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1507/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 වර්ෂයේදී රජය ලබා ගත් මුළු ණයවල වටිනාකම කොපමණද;

(ii) 2016 වර්ෂයේදී ලබා ගත් ණය සඳහා ගෙවිය යුතු බර තැබූ සාමාන්‍ය පොලී අනුපාතය කොපමණද;

(iii) වර්ෂ 2014 සහ 2015 ට සාපේක්ෂව, 2016 වර්ෂයේදී බර තැබූ සාමාන්‍ය පොලී අනුපාතය කොපමණ අගයකින් වෙනස් වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1544/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) අනුරාධපුරයේ පදිංචි, තිදරු මවක් වන සුජානි නමැති කාන්තාව කුවේට් රජයේ සේවයේ නියුතුව සිටියදී ඉතාමත් අමානුෂික අන්දමින් වද හිංසාවට ලක් වී ඇති බවත්;

(ii) එම අමානුෂික වද හිංසා හේතුවෙන් සුෂුම්නාවට දරුණු ලෙස හානි සිදුවී, ඇය කුවේට්හි අඩාන් රෝහලේ 17 වාට්ටුවේ ප්‍රතිකාර ගන්නා බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) සුෂුම්නාවට හානි සිදුවීම හේතුවෙන් එක්තැන් වී සිටින ඇය වහාම ශ්‍රී ලංකාවට ගෙන්වා ගත යුතු බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඇයට ලැබිය යුතු වන්දි මුදල්ද සමඟින් වහාම ලංකාවට ගෙන්වා ගැනීමට පියවර ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1782/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධිකරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1990 දෙසැම්බර් මස 31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, මුලතිව් දිස්ත්‍රික්කයේ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ ක්වාසි විනිසුරුවන් වශයෙන් පත්කරනු ලැබ සිටි තැනැත්තන් කවුරුන්ද;

(ii) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම ක්වාසි අධිකරණ කලාප ආවරණය වන ග්‍රාම නිලධාරී වසම් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එම ක්වාසි අධිකරණ කලාප වශයෙන් ප්‍රකාශයට පත්කරන ලද ගැසට් නිවේදන අංක හා දින සභාගත කරන්නේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1858/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මහානගර සැලසුම (Megapolis Plan) යටතේ 2017 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 03 ක් දක්වා මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් කවරේද;

(ii) දැනටමත් යම් වැඩසටහන් ආරම්භ කර ඇත්නම්, ඒවා කවරේද;

(iii) ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් නිශ්චිත වශයෙන් පටන් ගන්නා දින වකවානු කවරේද;

(iv) මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනටමත් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) දැනට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ සඳහා ණය මුදල් ලබා ගන්නේද;

(iv) එසේ නම්, ණය ලබා ගන්නා ආයතන සහ ණය ප්‍රමාණය කොපමණද;

(v) නොඑසේ නම්, රජය විසින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1877/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ 'ගඟේ වාඩිය' නමින් ගමක් තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම ගමේ ජීවත් වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගම්මානයේ ජීවත්වන ධීවර ජනතාව, මාළු අස්වැන්න අඩුවීම නිසා දැඩි දුෂ්කරතාවන්ට මුහුණ පා සිටින බව දන්නේද;

(iv) එසේ නම්, එම ගම්මානයේ ජනතාවට කිසියම් සහනයක් ලබාදීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1878/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016.04.01 දින සිට 2017.05.31 දින දක්වා කෘෂිකර්ම අමාත්‍යාංශය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ලේ මුළු විදුලි බිල කොපමණද;

(ii) එම කාලය තුළ රාජගිරියේ පිහිටි කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් කුලියට ගත් ඩී. පී. ජයසිංහ ගොඩනැගිල්ලේ මුළු විදුලි බිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1955/'17

ගරු කනක හේරත් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 අයවැයෙන් ග්‍රාම නිලධාරින්ගේ රාජකාරි කටයුතු පහසු කිරීම සඳහා ලබාදීමට පොරොන්දු වූ පරිගණක යන්ත්‍ර ලබාදීම ක්‍රියාත්මක වන්නේද;

(ii) මේ වනවිට ග්‍රාම නිලධාරින්ට පරිගණක යන්ත්‍ර ලබා දී ඇති දිස්ත්‍රික්ක සහ ලබා දී ඇති පරිගණක සංඛ්‍යාව කවරේද;

(iii) මේ වනවිට ග්‍රාම නිලධාරින්ට පරිගණක යන්ත්‍ර ලබා දී නොමැති දිස්ත්‍රික්ක සහ ලබා දීමට ඇති පරිගණක සංඛ්‍යාව කවරේද;

(iv) ඉහත (iii) හි සඳහන් පරිගණක ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ග්‍රාම නිලධාරින්ගේ කාර්යාල පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලි සඳහා කුලී වශයෙන් රජය මඟින් ගෙවනු ලබන දීමනාව ග්‍රාමීය සහ නාගරික ප්‍රදේශ අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ගෙවනු ලබන මෙම දීමනාව කාලීන වශයෙන් ප්‍රමාණවත් වන්නේද;

(iii) ප්‍රමාණවත් නොවේ නම්, මෙම දීමනාව වැඩි කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1978/'17

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝකයේ ප්‍රථම බෞද්ධ චෛත්‍ය වශයෙන් සැළකෙන ගිරිහඬු සෑය පූජා භූමිය දහස් ගණනක් ජනතාව පැමිණෙන ජාතික වැදගත් කමකින් යුතු පුණ්‍ය භූමියක් බවත්;

(ii) එම සිද්ධස්ථානයේ වාසය කරන භික්ෂූන් වහන්සේට සහ ස්ථානය නැරඹීම සඳහා පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ට අවශ්‍ය කරන ප්‍රමාණවත් ජල පහසුකම් එහි නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ගිරිහඬු සෑය පූජා භූමියේ ජල ප්‍රශ්නයට ස්ථිර විසඳුමක් ලබාදීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) පූජා භූමියේ ඇති පානීය ජල ගැටලුව විසඳීම සඳහා එම පූජා භූමිය තුළ ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබන ජල බවුසර කිහිපයක් දිනපතා ලබාදීමට පියවර ගන්නේද;

(iii) එසේ බවුසර මඟින් සපයන ජලය නිසිලෙස ගබඩා කොට නළ මඟින් බෙදාහැරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1981/'17

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහවැලි සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක වයඹ ඇල ව්‍යාපෘතියේ ප්‍රධාන ඇල මාර්ගය ගමන් ගන්නා දඹුල්ල, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල කි.මී. 20 ක දුර ප්‍රමාණයක ඇලට පහළින් පිහිටි දැනට වැසි දියෙන් පමණක් පෝෂණය වන කුඩා වැව් අමුණු ප්‍රමාණය, එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම කුඩා වැව් අමුණු පද්ධති සියල්ලම පෝෂණය කිරීම සඳහා වයඹ ඇල මඟින් වාරි ජලය සපයනු ලබන්නේද;

(iii) ඒ සඳහා මේ වනවිට සැලසුම් සකස් කර තිබේද;

(iv) ඉහත (i) හි සඳහන් වැව් අතරින් වයඹ ඇල ව්‍යාපෘතියෙන් ජලය සපයනු ලබන හා සපයනු නොලබන වැව්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ප්‍රධාන ඇලට පහළින් ඇති වැව් අමුණු පෝෂණය නොකර, වයඹ පළාතට ජලය සැපයීම දඹුල්ල, ගලේවෙල ගොවි ජනතාවට කරනු ලබන අසාධාරණයක් නොවන්නේද;

(vi) එයට පිළියමක් ලෙස ජලය සපයනු නොලබන වැව් සඳහා ජලය සැපයීමට සැලසුම් සකස් කර ක්‍රියාත්මක කරන්නේද;

(vii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1988/'17

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විවිධ දිස්ත්‍රික්කවල සිසුන් අඩු කඩඉම් ලකුණු සහිත දිස්ත්‍රික්කවල පාසල්වලට ඇතුළු වී වෙනත් දිස්ත්‍රික්කවල පිහිටා ඇති උසස් ප්‍රමිතියෙන් යුතු අධ්‍යාපන ආයතනවලින් අධ්‍යාපනය හදාරා අ.පො.ස. (උසස් පෙළ) විභාගයට ඉදිරිපත් වී එම දිස්ත්‍රික්කවලට අනුමත විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ පංගුවට (Quota) ඇතුළු වන බවත්;

(ii) ඉහත (i)හි සඳහන් කාරණය හේතුවෙන් අඩු කඩඉම් ලකුණු සහිත දිස්ත්‍රික්කවල ජීවත් වී එහිම අධ්‍යාපනය හදාරන සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා වූ පංගුවෙන් ප්‍රවේශය සඳහා වන අවස්ථාව අහිමි වී ඔවුන් මානසික පීඩාවකට ලක්වන බවත්;

(iii) විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී දිස්ත්‍රික්ක මට්ටමෙන් සිසුන් ශ්‍රේණිගත කිරීමේ පදනමින් සිසුන් විශ්වවිද්‍යාලවලට ඇතුලත් කර ගැනීමෙන් අනතුරුව, මෙම අනුපිළිවෙළෙහි වෙනසක් ඇති කිරීම පිළිබඳවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මෙලෙස කඩඉම් ලකුණු අඩු දිස්ත්‍රික්කවල අධ්‍යාපනය හදාරන සිසුන්ගේ මානසික තත්ත්වය සැලකිල්ලට ගෙන, වෙනත් දිස්ත්‍රික්කවල සිසුන්ගේ පැමිණීම නැවැත්වීමටත්, මෙලෙස සිසුන් ඇතුළත් කරගන්නා පාසල්වලට එරෙහිව කටයුතු කිරීමටත් පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1990/'17

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ, ජනගහනය හා භූගෝලීය තත්ත්වය සහ සාධක සැලකිල්ලට ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව වැඩි කිරීමේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අවස්ථාවේදී, එම සංඛ්‍යාව පහේ සිට දහය දක්වා වැඩි කිරීමට අමාත්‍යවරයා පොරොන්දු වූ බව පිළිගන්නේද;

(ii) එම ක්‍රියාවලියේ වර්තමාන තත්ත්වය කවරේද;

(iii) මෙය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අභියෝගයන් තිබේද;

(iv) එම යෝජනාව ක්‍රියාත්මක වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2017 නොවැම්බර් මස 11 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

544/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය අවසන් වනවිට ශ්‍රී ලංකාව තුළ මී කිරි නිෂ්පාදනය තම ජීවිකාව කරගත් පිරිස කොපමණද;

(ii) 2015 වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ මී කිරි නිෂ්පාදනය ලීටර් ප්‍රමාණය කොපමණද;

(iii) 2015 වර්ෂය අවසානයේදී ශ්‍රී ලංකාව තුළ සිටි මී ගවයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මී කිරි කර්මාන්තයේ නිරතවන්නන්ට එම කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් රජය විසින් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම පහසුකම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මී ගව ගහනය වැඩි කිරීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1224/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට අදාළව වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1401/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 173 යෝජනාවට අනුව, ග්‍රාමීය කෘෂිකර්මාන්තයට සහාය වනු පිණිස, කුඩා වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණ කිරීම සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 2000ක ප්‍රතිපාදනය මඟින් 2016 වර්ෂය තුළදී ප්‍රතිසංස්කරණය කරන ලද කුඩා වැව් හා ඇළ මාර්ග සහ ඒ වෙනුවෙන් දරන ලද පිරිවැය ඇතුළත් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(ii) නොඑසේ නම්, මන්ද;

(iii) කුඩා වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය පිළිබඳ වගකීම පවරන ලද අමාත්‍යාංශය සහ එම අමාත්‍යාංශයට 2016 වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරය විසින් මුදා හරින ලද මුදල් ප්‍රමාණය කවරේද;

(iv) රුපියල් මිලියන 2000ක් වූ මෙම දැවැන්ත ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීමට විවිධ මට්ටමින් දායක වූ ආයතන හෝ සංවිධාන කවරේද;

(v) ව්‍යාපෘතියෙහි අධීක්ෂණ කටයුතු වෙනුවෙන් වැය කරන ලද මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1476/’16

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ලංකාව තුළ ක්‍රියාත්මක වන පෞද්ගලික විදුලිබල ජනන සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමාගම්වල නම්, ලිපිනයන් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට එම එක් එක් සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලයට ලබා දුන් විදුලි ඒකක සංඛ්‍යාව සහ එම එක් සමාගමකට ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගෙවන ලද මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) වත්මන් යහපාලන රජය යටතේ ලංකා විදුලිබල මණ්ඩලය මඟින් සිදු කරනු ලබන විදුලි ජනනය වැඩි කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1578/’17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රටේ සමස්ත බදුවලින් 57 %ක් අයකර ගනු ලබන්නේ ශ්‍රී ලංකා රේගුව විසින් බවත්;

(ii) ඉන් වැඩි බදු ප්‍රතිශතයක් වාහන ආනයන බදු බවත්;

(iii) බදු නොගෙවීමට වාහන ආනයනකරුවන් විවිධ උපක්‍රම භාවිතා කරන බවත්;

(iv) දැනට නිකුත් කර ඇති අති විශේෂ ගැසට් නිවේදනවලට අමතරව, 2015.02.10 දිනැති අංක 1901/3 ගැසට් නිවේදනය මඟින්ද, මෙම තත්ත්වය මඟ හැරවීමට නියෝග පනවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කෙසේ වෙතත්, 2015.09.22 දිනැති අංක 1933/6 ගැසට් නිවේදනයෙන් ජාවාරම්කරුවන්ට රිසි ලෙස කටයුතු කිරීමට අවස්ථාව ලබා දී ඇති බවත්;

(ii) අ (iv)හි සඳහන් ගැසට් නිවේදනයෙන් ලබා දුන් අධිකාරි බලය මත රේගු නිලධාරීන් අනාවරණය කරගත් මිල අඩුවෙන් සඳහන් වාහන 1000 සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කළහොත්, රු.මිලියන 8000කට අධික ආදායමක් අය කර ගත හැකි බවත්;

(iii) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියෝගය අනුව 2016.09.21 දින සියලු රේගු පරීක්ෂණයන් තාවකාලිකව අත්හිටුවා දැනට මාස 04ක් ගතවීමෙන් රටට විශාල ආදායමක් අහිමි වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, අ (iv)හි සඳහන් නියෝගය අවලංගු කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1783/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධිකරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1990 දෙසැම්බර් මස 31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ ක්වාසි විනිසුරුවන් වශයෙන් පත්කරනු ලැබ සිටි තැනැත්තන් කවුරුන්ද;

(ii) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම ක්වාසි අධිකරණ කලාප ආවරණය වන ග්‍රාම නිලධාරී වසම් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එම ක්වාසි අධිකරණ කලාප වශයෙන් ප්‍රකාශයට පත්කරන ලද ගැසට් නිවේදන අංක හා දින සභාගත කරන්නේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1859/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මහානගර සැලසුම (Megapolis Plan) යටතේ 2017 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 03ක් දක්වා මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් කවරේද;

(ii) දැනටමත් යම් වැඩසටහන් ආරම්භ කර ඇත්නම්, ඒවා කවරේද;

(iii) ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් නිශ්චිත වශයෙන් පටන් ගන්නා දින වකවානු කවරේද;

(iv) මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනටමත් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) දැනට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ සඳහා ණය මුදල් ලබා ගන්නේද;

(iv) එසේ නම්, ණය ලබා ගන්නා ආයතන සහ ණය ප්‍රමාණය කොපමණද;

(v) නොඑසේ නම්, රජය විසින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1879/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.08 දින සිට මේ දක්වා කැබිනට් අමාත්‍යවරයන්, රාජ්‍ය අමාත්‍යවරයන් හා නියෝජ්‍ය අමාත්‍යවරයන් සඳහා වාහන මිලදී ගත් අවස්ථා කවරේද;

(ii) එක් එක් වාහනයේ වර්ගය හා මිල කවරේද;

(iii) එම වාහන සඳහා වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1979/'17

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තිරියාය ප්‍රදේශයේ පිහිටි ගිරිහඬු සෑය පූජා භූමියට අයත් ඉඩම් මැන අවසන් කර තිබේද;

(ii) එසේ නම්, මැන හඳුනාගත් භූමිය මත සලකුණු යෙදීම සිදුකර තිබේද;

(iii) මැනීම් මඟින් හඳුනාගෙන ඇති පූජා භූමියට අයත්වන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) අදාළ පිඹුරුපත් බුද්ධශාසන අමාත්‍යාංශයට ලබා දීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1989/'17

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අංක 11, දුම්රියපොළ පාර, මන්නාරම යන ලිපිනයෙහි පිහිටා ඇති (ඔප්පු අංක 16) පර්චස් 190ක භූමිභාගය, 1872.12.17 දින මන්නාරම ඉඩම් කාර්යාලය විසින් මෙතොදිස්ත සභාවට අයත් ඉඩමක් ලෙස ලියාපදිංචිකර ඇති (ලියාපදිංචි අංක B 1/53) බවත්;

(ii) 1985 වර්ෂයේ රටේ ඇති වූ නොසන්සුන් වාතාවරණය හේතුවෙන් මෙම ඉඩම නඩත්තු කිරීමට නොහැකිව පැවති අවස්ථාවේදී, ශ්‍රී ලංකා යුද හමුදාව අදාළ ඉඩමෙහි කාර්යාලයක් ස්ථාපිත කළ බවත්;

(iii) එම කාර්යාලය සඳහා මන්නාරම නගරයට ආසන්න ප්‍රදේශයක භූමිභාගයක් වෙන්කරදී වර්ෂ 3කට අධික කාලයක් ගත වී ඇතත්, මෙතෝදිස්ත සභාවට අයත් මෙම ඉඩම මේ දක්වා යුධ හමුදාව විසින් නිදහස්කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ වනවිට මෙතෝදිස්ත සභාවට දැඩිලෙස අවශ්‍ය වී ඇති අදාළ ඉඩම ඉක්මනින් මුදාහැරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1991/'17

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතුයායවල් පිහිටි ප්‍රදේශවල පිහිටා තිබෙන ප්‍රාදේශීය සභාවන්ට තමන්ගේ සේවාවන් ඉටු කිරීමට නොහැකිවනසේ ප්‍රාදේශීය සභා නීති විධිවිධානයන් අන්තර්ගත වී ඇති බවත්;

(ii) ඒවා සංශෝධනය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති බවත්;

(iii) මේ සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් යොමු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම නීති, විධිවිධාන සංශෝධනවල වත්මන් තත්ත්වය කවරේද;

(ii) එම සංශෝධන සිදු කිරීම සඳහා කිසියම් බාධාවන් තිබේද;

(iii) මෙම නීති සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1994/'17

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර ශික්ෂණ රෝහල සතු මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ප්‍රමාණයෙන් දැනට රෝහල විසින් භාවිතා කරනු ලබන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) රෝහල සතු ඉඩම්වලින්, විශාල භූමි ප්‍රමාණයක් අනවසරයෙන් භුක්ති විඳින බව දන්නේද;

(iv) එම තත්ත්වය රෝහලේ කටයුතුවලට බාධාවක් වී ඇති බව පිළිගන්නේද;

(v) එසේ නම්, මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1995/'17

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2017 ජූනි 30 දක්වා ජනාධිපතිවරයා විසින් ජනාධිපති නීතිඥයන් වශයෙන් නම් කරන ලද පුද්ගලයන්ගේ නාමලේඛනයක් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නේද;

(ii) ජනාධිපති නීතිඥයන් නම් කිරීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2073/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 වර්ෂයේදී වවුනියාව, නෙඩුන්කර්ණි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාන්කුලම් ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, පුදුවිලාන්කුලම්, පුට්කුලම්, කුංජුකුලම්, මන්නකුලම්, කොල්ලර් පුලියන්කුලම් යන ගම්මාන 05ක පවුල් 270ක් පමණ නැවත පදිංචි කරන ලද බවත්;

(ii) මෙම ගම්මාන මුලතිව් සහ වවුනියාව යන දිස්ත්‍රික්කවලට මායිම්ව පවතින බවත්;

(iii) නැවත පදිංචි කරන ලද කාලයේ සිට මේ දක්වා මෙම ජනතාවට කිසිදු මූලික පහසුකම් හෝ නොමැතිව දැඩි පීඩාවන්ට මුහුණ පා සිටින බවත්;

(iv) A - 9 මාර්ගයට පැමිණීම සඳහා ප්‍රවේශ මාර්ග නොමැති වීම සහ ගම්මාන හරහා තිබෙන දුම්රිය මාර්ගයට හරස්ව වැටී ඇති පාරවල් සඳහා ආරක්ෂාකාරි දුම්රිය ගේට්ටු නොමැති වීමෙන් මෙම ජනතාව විවිධ දුෂ්කරතාවයන්ට මුහුණ පා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගම්මානවලට අවශ්‍ය මූලික පහසුකම් ලබා දීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පහසුකම් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2118/'17

ගරු ජයන්ත සමරවීර මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017.05.27 දින ඇති වූ ගංවතුර හා නායයෑමේ ආපදා තත්ත්වයෙන් කළුතර දිස්ත්‍රික්කය තුළ මියගිය සහ අතුරුදන් වූ පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ගංවතුරෙන් හා නායයෑමෙන් මියගිය පුද්ගලයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම ව්‍යසනයෙන් මියගිය සහ අතුරුදන් වූ පුද්ගලයන්ගේ,

(i) නම,ලිපිනය,වයස,රැකියාව සහ ස්ත්‍රී / පුරුෂ භාවය;

(ii) ග්‍රාම නිලධාරි වසම හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය;

(iii) ළඟම ඥාතිවරයාගේ නම සහ ලිපිනය;

කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එලෙස මියගිය හෝ අතුරුදහන් වූ පුද්ගලයන් වෙනුවෙන් මේ වනවිට වන්දි ගෙවා තිබේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන්ගේ නම් සහ ගෙවා ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වන්දි ගෙවා අවසන් කිරීමට අපේක්ෂිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 නොවැම්බර් මස 16 වැනි බ්‍රහස්පතින්දා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

589/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රක්ෂිත තුළ පවත්වාගෙන යනු ලබන හෝටල් ව්‍යාපාරය හා සම්බන්ධ පෞද්ගලික ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම ව්‍යාපාර සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අවසර ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත ආයතනයන්ගෙන් වනාන්තරයට සිදුවන බලපෑම් සම්බන්ධයෙන් නිරන්තරයෙන් පරීක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

(iii) ඉහත (i) හා (ii) සම්බන්ධ ක්‍රියාවලියේදී වන විනාශයට හේතු වන ආකාරයෙන් කටයුතු කළ ආයතනයන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම ආයතන සහ ලබාදුන් දඬුවම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1226/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1402/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 169 යෝජනාවට අනුව, කුරුඳු හා ඒ ආශ්‍රිත පර්යේෂණ සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 5ක ප්‍රතිපාදනය වැය කළ ආකාරය පිළිබඳ වැය විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

(ii) උක්ත අයවැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන භාවිතා කර සිදු කරන ලද පර්යේෂණ සංඛ්‍යාව, එම පර්යේෂණ සිදුකළ පර්යේෂකයන්ගේ නම් සහ ඒවායේ කාර්ය සාධන වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) කුළුබඩු (ගම්මිරිස්, කරාබු නැටි සහ සාදික්කා) අපනයන සඳහා වූ සෙස් බදු ඉවත් කිරීම හේතුවෙන් 2016 වර්ෂයේදී සිදුවූ සෙස් බදු ආදායම් අහිමිවීමේ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1644/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ එක් එක් පළාත් පාලන ආයතනයේ භූමි ප්‍රමාණය, ජනගහනය, ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(ii) පළාත් පාලන ආයතනයක භූමි ප්‍රමාණය විශාල වීම, ජනගහනය අධික වීම වැනි හේතු මත බදුල්ල දිස්ත්‍රික්කය තුළ අළුතින් පළාත් පාලන ආයතන පිහිටුවීමට යෝජනා වී තිබේද;

(iii) එසේ නම්, යෝජිත අළුත් පළාත් පාලන ආයතන හා ඉන් ආවරණය වන ග්‍රාම නිලධාරි කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1784/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධිකරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1990 දෙසැම්බර් මස 31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, මන්නාරම දිස්ත්‍රික්කයේ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ ක්වාසි විනිසුරුවන් වශයෙන් පත්කරනු ලැබ සිටි තැනැත්තන් කවුරුන්ද;

(ii) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම ක්වාසි අධිකරණ කලාප ආවරණය වන ග්‍රාම නිලධාරී වසම් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එම ක්වාසි අධිකරණ කලාප වශයෙන් ප්‍රකාශයට පත්කරන ලද ගැසට් නිවේදන අංක හා දින සභාගත කරන්නේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1805/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් දුම්රිය එන්ජින්වලින් දැනට භාවිතයට ගතහැකි එන්ජින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එන්ජින් වර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනට ලෝකයේ බොහෝ රටවල M2 හා M3 වර්ගයේ එන්ජින් දිගුකාලයක් තිස්සේ ධාවනය වන බවත්;

(ii) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් එම වර්ගයේ එන්ජින් 27ක් භාවිතයෙන් ඉවත් කිරීමට පියවර ගනිමින් ඇති බවත්;

(iii) එම එන්ජින්වල අමතර කොටස් ගෙන්වීම නැවැත්වීම සඳහා රත්මලාන යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) තව වසර ගණනාවක් සේවයේ යෙදවිය හැකි මෙම දුම්රිය එන්ජින් ගර්හිත කර විනාශ කිරීමේ අරමුණ කවරේද;

(ii) මෙයට පෙර දුම්රිය කාර්ය මණ්ඩලයේ විරෝධය නොතකා, ප්‍රංශයෙන් ගෙන්වන ලද M9 වර්ගයේ දුම්රිය එන්ජින් 09න් මේ වනවිට භාවිතයට ගත හැක්කේ එන්ජින් 03ක් බව දන්නේද;

(iii) එබැවින් මෙම M2 හා M3 වර්ගයේ එන්ජින් භාවිතයෙන් ඉවත් කිරීම නැවැත්වීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1860/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙගාපොලිස් සැලසුම යටතේ 2017 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 03 ක් දක්වා රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් කවරේද;

(ii) දැනටමත් යම් වැඩසටහන් ආරම්භ කර ඇත්නම්, ඒවා කවරේද;

(iii) ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් නිශ්චිත වශයෙන් පටන් ගන්නා දින වකවානු කවරේද;

(iv) මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනටමත් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) දැනට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ සඳහා ණය මුදල් ලබා ගන්නේද;

(iv) එසේ නම්, ණය ලබා ගන්නා ආයතන සහ ප්‍රමාණය කොපමණද;

(v) නොඑසේ නම්, රජය විසින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1956/'17

ගරු කනක හේරත් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙවර යල කන්නයේදී කෑගල්ල, රත්නපුර, කළුතර, ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල වගා කළ කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) නිරිත දිග මෝසම් වැසි සක්‍රිය වීමත් සමඟ ඇති වූ අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ඉහත දිස්ත්‍රික්කවල විනාශයට පත්වූ කුඹුරු අක්කර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කුඹුරු ගොවිතැන් හානියට පත් වීමෙන් අසරණ වී සිටින ගොවීන්ට වන්දි මුදලක් ගෙවීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 නොවැම්බර් මස 17 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1227/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1337/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 වර්ෂයේදී ඉසෙඩ් ලකුණු එක් එක් විශ්වවිද්‍යාලයට අදාළව නිකුත්කර ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් ඇතැම් ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී ඇති බවත්;

(iii) මෙම ක්‍රමවේදය හේතුවෙන් ඔවුන්ට විශාල අසාධාරණයක් සිදුවී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) අසාධාරණයට ලක්වූ ශිෂ්‍යයන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

(iii) එය ක්‍රියාත්මකවන දිනය කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1403/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි 174 යෝජනාවට අනුව, ජාතික පාරිසරික සංරක්ෂණ වැඩසටහන යටතේ අමතර වැඩසටහන් සඳහා වෙන්කළ රුපියල් මිලියන 2000ක ප්‍රතිපාදන 2016 වර්ෂය තුළදී වැයකළ ආකාරය පැහැදිලි කරන්නේද;

(ii) උක්ත යෝජනාව අනුව මූල්‍ය ප්‍රතිපාදන ලබා දුන් "අමතර වැඩසටහන්" කවරේද;

(iii) මෙකී අමතර වැඩසටහන් සඳහා වගකීම දරන ලද ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) උක්ත අයවැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී,

(i) පාරිසරික සමතුලිත බව ආරක්ෂා කිරීම, තිරසර ඉඩම් කළමනාකරණය;

(ii) ජීව සම්පත් සංරක්ෂණය;

(iii) පරිසර දූෂණය පාලනය;

(iv) වන සම්පත ආරක්ෂා කිරීම;

සඳහා වැය කර ලද මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1645/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාව යටතේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොන්ත්‍රාත්කරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) ඌව පළාත් සභාවේ වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා එම ධූරයට පත්වීමෙන් පසු මේ දක්වා කොන්ත්‍රාත් ලබාදී ඇති කොන්ත්‍රාත්කරුවන්ගේ නම්, හා ඔවුනට ලබාදුන් කොන්ත්‍රාත් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් කොන්ත්‍රාත්තුව වෙනුවෙන් අදාළ කොන්ත්‍රාත්කරුවන්ට පළාත් සභාව මඟින් ගෙවා ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) අදාළ කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී පළාත් සභාව අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1757/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සී/ස ලංකා සෝල්ට් සමාගමේ කොටස්වලින් 90% හිමි වනුයේ සේවක භාරකාර අරමුදලට (ETF) බවත්, ලංකාවේ මුළු ලුණු වෙළඳපොළෙන් 60% කට වඩා වැඩි ප්‍රමාණයක් අත්කරගෙන ඇත්තේ මෙම සමාගම බවත්;

(ii) 2015 වර්ෂය ආරම්භයේ සමාගමේ සිටි 500ක් වූ අනියම් හා ස්ථිර සේවක සංඛ්‍යාව, මේ වනවිට 1000 ඉක්මවා ඇතත්, ලුණු නිෂ්පාදනයේ පැහැදිලි වැඩි වීමක් සිදු වී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සමාගම තුළ නිශ්චිත භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේ හෝ ලුණු විකිණීමේ ප්‍රතිපත්තියක් නොමැති වීම සහ වංචා හා දූෂණ හේතුවෙන් මේ වනවිට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පරීක්ෂණයක් ආරම්භකර ඇති බව එතුමා දන්නේද;

(ii) අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යයක් වන ලුණු මිල මෙසේ දරාගත නොහැකි අන්දමින් ඉහළයාම නවතා, සාධාරණ මිලකට ලුණු ලබාදීමට සහ වංචා සහ දූෂණ දුරු කිරීම සඳහා වහාම පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1785/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධිකරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 1990 දෙසැම්බර් මස 31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, වව්නියාව දිස්ත්‍රික්කයේ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ ක්වාසි විනිසුරුවන් වශයෙන් පත්කරනු ලැබ සිටි තැනැත්තන් කවුරුන්ද;

(ii) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම ක්වාසි අධිකරණ කලාප ආවරණය වන ග්‍රාම නිලධාරී වසම් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එම ක්වාසි අධිකරණ කලාප වශයෙන් ප්‍රකාශයට පත්කරන ලද ගැසට් නිවේදන අංක හා දින සභාගත කරන්නේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1841/'17

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවා ලංකා ආයතනය මඟින් 'හරිත යුගයක් කරා' යන වැඩසටහන යටතේ මුලතිව් දිස්ත්‍රික්කයේ ගොවිපොළවල් ආරම්භ කළ බව දන්නේද;

(ii) එසේ නම්, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව එම ගොවිපළවල් පිහිටි ස්ථාන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මෙම වැඩසටහන් සඳහා වැය වූ මුදල කොපමණද;

(iv) එම ගොවිපොළවල් මේ වනවිට ප්‍රයෝජනයට නොගන්නා බව දන්නේද;

(v) මෙම ප්‍රදේශයේ තිබෙන ලියාපදිංචි සංවිධානවලට මෙම ගොවිපළවල් භාරදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1861/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මහානගර සැලසුම (Megapolis Plan) යටතේ 2017 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 03 ක් දක්වා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් කවරේද;

(ii) දැනටමත් යම් වැඩසටහන් ආරම්භ කර ඇත්නම්, ඒවා කවරේද;

(iii) ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් නිශ්චිත වශයෙන් පටන් ගන්නා දින වකවානු කවරේද;

(iv) මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනටමත් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) දැනට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ සඳහා ණය මුදල් ලබා ගන්නේද;

(iv) එසේ නම්, ණය ලබා ගන්නා ආයතන සහ ණය ප්‍රමාණය කොපමණද;

(v) නොඑසේ නම්, රජය විසින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2017 නොවැම්බර් මස 18 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

100/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නීතිවිරෝධීව බෝට්ටු මඟින් ඕස්ට්‍රේලියාවට ගිය ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් එහි රැඳවුම් කඳවුරු තුළ සිටින බවත්;

(ii) එම ජනතාවට එම කඳවුරුවල අවම පහසුකම්වත් නොමැති බවත්;

(iii) ඔවුන් නැවත මෙරටට ගෙන ඒමට රජය මෙතෙක් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ක්‍රිස්මස් දූපතේ, පැපුවානිව්ගිනියාවේ, ඕස්ට්‍රේලියාවේ හා නාවුරුහි පිහිටි කඳවුරු තුළ සිටින ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව පිළිබඳ සොයා බැලීමක් කර තිබේද;

(ii) එසේ නම්, එම කඳවුරු තුළ සිටින ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් මෙරටට ගෙන්වා ගැනීමට රජය පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1043/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2016 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා මණ්ඩල වාර්ෂික සැසිය සඳහා ජනාධිපතිතුමාගේ සංචාරයට සහභාගි වූ දූත පිරිස කොපමණද;

(ii) උක්ත සංචාරයට සහභාගි වූ පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් දූත පිරිසට ඇතුළත් වූ පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සංචාරය සඳහා රජය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රාජ්‍ය සමාගම් විසින් දැරූ සම්පූර්ණ පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1198/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මුලතිව් දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේදී යුද්මය තත්ත්වය නිම වනතෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1278/'16

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) 2015.10.01 දිනට අධ්‍යාපන සේවා නියුක්තයන්ගේ සමූපකාර සකසුරුවම් හා ණය දෙන සමිතිය සතුව පවතින සම්පූර්ණ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) 2016.06.11 වනවිට එම සමිතිය සතුව තිබූ ස්ථිර තැන්පතු ප්‍රමාණය කොපමණද;

(iii) මේ වනවිට ඉහත කී සමිතියෙන් ණය අයදුම්කර ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ණය අයදුම්කරුවන් අතරින්, ණය අනුමත වූ නමුත්, මෙතෙක් ණය මුදල් මුදා හැර නොමැති සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(v) එම ණය අයදුම්කරුවන්ට ගෙවිය යුතුව ඇති ණය මුදල්වල එකතුව කොපමණද;

(vi) එකී ණය අයදුම්කරුවන් වෙත ණය මුදල් මුදා හැරීම ප්‍රමාද වීමට හේතුව කවරේද;

(vii) ඉහත කී සමිතිය තම සාමාජිකයන් වෙත නිසි ලෙස ණය මුදල් මුදා හැරීමට නොහැකි තත්ත්වයකට පත්වී ඇති බව දන්නේද;

(viii) එසේ නම්, එම සමිතියේ මූල්‍ය පාලනය විධිමත් කිරීම සඳහා ඉදිරියේ දී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1388/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2016 අයවැයෙහි අංක 142 යෝජනාවට අනුව, දේශීය කිරි නිෂ්පාදනය සඳහා අවම ආයෝජනය රුපියල් මිලියන 25කට යටත්ව පෞද්ගලික ආයෝජකයන්ට ඌන උපයෝජිත රජයේ ඉඩම් ලබා දීමට අදහස් කළ බව පිළිගන්නේද;

(ii) ඉහත යෝජනාවට අනුව රජයේ ඉඩම් ඉල්ලුම් කළ සමාගම් හෝ පුද්ගලයන් සංඛ්‍යාව සහ ඔවුන්ගේ නම් කවරේද;

(iii) භාවිතයට නොගත් හා ඌන උපයෝජිත රජයේ ඉඩම් පිළිබඳ ලැයිස්තුවක් සභාගත කරන්නේද;

(iv) බාහිර ගොවීන් ලවා ඉහළ ඵලදායිතාවයෙන් යුත් තෘණ වගා කිරීම සඳහා ඉහත ඉඩම්වලින් ලබා දුන් අක්කර ගණන කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1545/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— සමාජ සවිබලගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 වර්ෂයේදී දිවිනැගුම සහනාධාර ලබන ප්‍රතිලාභීන්ගේ නිවාස අලුත්වැඩියා කර ගැනීම සඳහා රු.2500/-ක මුදලක් ප්‍රදානයක් ලෙස ලබා දී තිබේද;

(ii) එම මුදල දිවිනැගුම ප්‍රජාමූල බැංකුවෙන් ලබා දෙනු ලැබුවේ භාණ්ඩාගාරය මඟින් ප්‍රතිපූරණය කිරීමේ පදනම මතද;

(iii) එසේ නම්, මේ වනවිට එම මුදල ප්‍රතිපූරණය කර තිබේද;

(iv) නිවාස අලුත්වැඩියා කිරීම සඳහා මුදල් ලබා ගත් පුද්ගලයන්ගෙන් එම මුදල නැවත අයකර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1549/'17

ගරු ඉම්රාන් මහරුෆ් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කින්නියා, එළිලරංගු ක්‍රීඩාපිටිය පසුගිය වසර කිහිපයක සිට සංවර්ධනය කරමින් පවතින බවත්;

(ii) එහි සංවර්ධන කටයුතු සඳහා වෙන්කරන ලද මුදල කොපමණද;

(iii) ඒ හරහා සිදුකරනු ලබන වැඩකටයුතු කවරේද;

(iv) ඉහත කටයුතු පිළිබඳ එහි සිටින රාජ්‍ය නිලධාරීන් නොදන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එළිලරංගු ක්‍රීඩාපිටියේ සංවර්ධන කටයුතු සඳහා වර්ෂ 2011 සිට 2015 දක්වා වෙන් කරන ලද මුදල් ප්‍රතිපාදනය, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එමඟින් සිදුකරන ලද සංවර්ධන කටයුතු කවරේද;

(iii) උක්ත සංවර්ධන කටයුතු පිළිබඳව ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෝ නැගෙනහිර පළාත් සභාව හෝ නොදැනුවත්ව අමාත්‍යාංශය විසින් සෘජුව කටයුතු කරනු ලැබීමට හේතුව කවරේද;

(iv) සංවර්ධන කටයුතු සිදුකරනු ලබන කොන්ත්‍රාත්කරු කවුරුන්ද;

(v) එම කොන්ත්‍රාත්කරුට වැඩ පවරා ඇති පදනම කවරේද;

(vi) දීර්ඝ කාලයක් ගතවී ඇතත්, සංවර්ධන කටයුතු තවමත් සම්පූර්ණ නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) යහපාලන රජය යටතේ සිදුකරනු ලබන සියලුම සංවර්ධන වැඩකටයුතු පිළිබඳව විනිවිද භාවයක් පැවතීම තහවුරු කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1640/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන කවරේද;

(ii) එම ආයතන කුලී පදනමින් ලබාගත් ගොඩනැගිලිවල පවත්වාගෙන යන්නේ නම්, එම ගොඩනැගිලිවල නම් සහ එම ගොඩනැගිලිවල අයිතිකරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් ගොඩනැගිල්ල වෙනුවෙන් අමාත්‍යාංශය විසින් ගෙවනු ලබන වාර්ෂික කුලිය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අමාත්‍යාංශය විසින් ගොඩනැගිලි කුලියට ගැනීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 නොවැම්බර් මස 20 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

112/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) තඹුත්තේගම රෝහලේ සායන ගොඩනැගිල්ල සාදා නිම කර රෝහලට භාර දුන් දිනය කවරේද;

(ii) එම ගොඩනැගිල්ල සඳහා වියදම් කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත ගොඩනැගිල්ල ඉදි කළ කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

(ii) අදාළ කොන්ත්‍රාත්කරුට සම්පූර්ණ මුදල ගෙවා තිබේද;

(iii) එසේ නම්, ගෙවූ මුදල කොපමණද;

(iv) එම කොන්ත්‍රාත්කරුගේ මුදල් රඳවා ගෙන තිබේද;

(v) එසේ නම්, රඳවාගෙන ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ගොඩනැගිල්ලෙහි බිත්ති පුපුරා ගොස් ඇති බවත්;

(ii) මේ නිසා රෝගීන්ගේ හා රෝහල් කාර්ය මණ්ඩලයේ ජීවිත වලට තර්ජනයක් ඇති බවත්;

(iii) මේ වනතෙක් එම ගොඩනැගිල්ල අලුත්වැඩියා කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඈ) (i) මෙම ගොඩනැගිල්ල පිළිසකර කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම පිළිසකර කිරීම් කටයුතු සිදු කරනු ලබන කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1153/'16

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හෝමාගම හා බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශ දෙකටම අයත් අක්කර 98 ක වපසරියකින් යුත් බඳුවිල වත්ත ඉඩමේ සංචාරක නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අනුමතිය ලබාදී තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන සමාගමේ නම හා ලිපිනය කුමක්ද;

(iii) එම නිවාස ව්‍යාපෘතිය හේතුවෙන් එම ප්‍රදේශයේ බලවත් පාරිසරික හානියක් සිදුවන බව දන්නේද;

(iv) එම නිවාස ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමතිය ලැබී තිබේද;

(v) එම ව්‍යාපෘතිය සඳහා පරිසර අධ්‍යයන වාර්තාවක් සකස් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1176/'16

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2010 සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදයේදී, සීමාසහිත ලංකා රෝහලේ කොටස් හිමියෙකු ලෙස ගෝඨාභය රාජපක්ෂ මහතා කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම කාල පරිච්ඡේදය තුළදී සීමාසහිත ලංකා රෝහලේ සභාපති ලෙස ඒ මහතා ලබාගත් වැටුප් සහ දීමනා කවරේද;

(iii) වර්ෂ 2010 සිට 2015 දක්වා කාලය තුළ සීමාසහිත ලංකා රෝහල වාර්තා කළ වාර්ෂික ලාභය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1199/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කිලිනොච්චිය දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේ යුද්මය තත්ත්වය නිම වනතෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුද්මය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1416/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2016 අයවැයෙහි අංක 199 යෝජනාවට අනුව, විනිමය පාලන පනත අහෝසි කිරීමට යෝජනා කිරීමේ අරමුණු කවරේද;

(ii) උක්ත අරමුණු ඉටුකර ගැනීමට අදාළ වන අයුරින් හඳුන්වාදීමට අපේක්ෂිත විනිමය කළමනාකරණ පනතෙහි අඩංගුවන ප්‍රධාන වෙනස්කම් කවරේද;

(iii) විනිමය කළමනාකරණ පනත මඟින් ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලාවෙහි ප්‍රාග්ධන ගිණුම විවෘත කිරීමට අදහස් කරන්නේද;

(iv) සාර්ක් කලාපය ඇතුළු දකුණු ආසියාතික රටවල ගෙවුම් තුලාවෙහි ප්‍රාග්ධන ගිණුම විවෘත කර ඇති රටවල් කවරේද සහ එම රටවල්වල ඇති වූ විදේශ මූල්‍ය ප්‍රවාහ ප්‍රවනතා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1540/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ජල මූලාශ්‍ර සිඳී යෑමෙන් උඩපේරුව, අරාවත්ත, මකුල් ඇල්ල සහ එගොඩගම ඇතුළු බදුල්ල දිස්ත්‍රික්කයේ ජනතාව විශාල පීඩාවකට ලක් වී ඇති බව දන්නේද;

(ii) එම ජනතාවට පානීය හා වෙනත් ජල පහසුකම් ලබාදීමට අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1595/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ දැනට ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම එක් එක් පළාත් පාලන ආයතනය මඟින් සේවා සපයනු ලබන ජන සංඛ්‍යාව, භූමි ප්‍රමාණය සහ ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජනතාවට වැඩි පහසුකම් සපයා දීම සඳහා පුත්තලම දිස්ත්‍රික්කය තුළ අළුතින් ස්ථාපිත කිරීමට යෝජිත පළාත් පාලන ආයතන කවරේද;

(v) එසේ යෝජනා වී ඇති පළාත් පාලන ආයතන කඩිනමින් පිහිටුවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1615/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ දැවි තෙල් ආශ්‍රිතව විදුලි බලය නිපදවීමේ බලාගාරයක් ඇති බවත්;

(ii) මෙම බලාගාරයෙන් දැඩි පාරිසරික හානියක් සිදුවන බවත්;

(iii) මෙම බලාගාරය සඳහා පාරිසරික බලපත්‍ර ලබාදීම නිසි පරිදි සිදු නොවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මෙම බලාගාරය අයත් සමාගම කවරේද;

(ii) මෙම සමාගම සමඟ ගිවිසුම්ගත කාලසීමාව කවරේද;

(iii) මෙම පාරිසරික හානිය අවම කර ප්‍රදේශයේ ජන ජීවිතයට සහනයක් සැලසීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 නොවැම්බර් මස 21 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

115/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මීගමුව කලපු මෝය ආශ්‍රිතව පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කඩොලාන භූමි ප්‍රදේශයෙන් අක්කර අටක ප්‍රදේශයක නිවාස ව්‍යාපෘතියක් ඇතුළු සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට සැලසුම් කර ඇති බවත්;

(ii) මෙම ව්‍යාපෘතියට පරිසරවේදීන් විරෝධය පළකර තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම සැලසුමට අනුව උක්ත භූමි භාගයේ යෝජිත ඉදිකිරීම් කවරේද;

(ii) ඉහත කඩොලාන බිමෙහි ඉදිකිරීම් සිදු කිරීමට වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අවසර ගෙන තිබේද;

(iii) එසේ නම්, ඉදිකිරීම් කටයුතු අරඹන දිනය කවරේද;

(iv) ඉදිකිරීම් කටයුතු සඳහා අවසර ලබාදීමට අදාළ ලියකියවිලි ඉදිරිපත් කරන්නේද;

(v) නොඑසේ නම්, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සිදු කරන නීත්‍යානුකූල ක්‍රමවේදය කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1201/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේ යුදමය තත්ත්වය නිමවන තෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1418/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2016 අයවැය යෝජනා අංක 198 හි දැක්වෙන පරිදි 2015 සහ 2016 වර්ෂ තුළදී,

(i) තෙල් පිරිපහදුව;

(ii) පුනර්ජනනීය බලශක්තිය;

(iii) ඒකාබද්ධ මෝටර් රථ නිෂ්පාදනය;

(iv) කලාපය සඳහා වානේ පාලම් නිෂ්පාදනය;

(v) පොහොර, ට්‍රිපල් සුපර් ෆොස්ෆේට් නිෂ්පාදනය;

(vi) චන්ද්‍රිකා තාක්ෂණය;

(vii) ගුවන් යානා අළුත්වැඩියාව සහ එයට සහායක ක්‍රියාවන්;

(viii) ඒකාබද්ධ සීනි නිෂ්පාදනය;

යන ක්ෂේත්‍ර වෙනුවෙන් ශ්‍රී ලංකාවට ලැබුණු විදේශ ආයෝජන කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2015.01.01 දිනට ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල විදේශීය ආයෝජන ප්‍රමාණය කොපමණද;

(ii) 2017.01.01 දිනට රජයේ සුරැකුම්පත්වල විදේශ ආයෝජන ප්‍රමාණය කොපමණද;

(iii) ෆිච් රේටිං සහ මෝඩි ආයතන විසින් 2014, 2015, 2016 යන වර්ෂයන්හිදී ශ්‍රී ලංකාවට ලබා දුන් ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1511/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂය තුළ වාර්තා වූ රිය අනතුරු සංඛ්‍යාව සහ රිය අනතුරු හේතුවෙන් සිදු වූ මරණ සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2014 සහ 2015 ට සාපේක්ෂව, 2016 වර්ෂය තුළදී සිදු වූ රිය අනතුරු සංඛ්‍යාව සහ රිය අනතුරු හේතුවෙන් සිදු වූ මරණ සංඛ්‍යාව කොපමණ සංඛ්‍යාවකින් ඉහළ ගොස් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1585/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) Commonwealth Game නමැති ගිණුමක් ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන්නේද;

(ii) එසේ නම්, ඒ කවුරුන් විසින්ද;

(iii) එය ආරම්භ කළ දිනය කවරේද;

(iv) එම ගිණුමට රජයේ මුදල් හා පරිත්‍යාග කොපමණ බැර වී තිබේද;

(v) මේ වනවිට එම ගිණුමේ ඉතිරිව ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1620/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇඹිලිපිටිය නගරය තුළ ව්‍යාපාරික ස්ථාන හිමි ව්‍යාපාරිකයන්ට තම ව්‍යාපාරික ස්ථාන සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවට බදු ගෙවීමට සිදුවී ඇති බව දන්නේද;

(ii) මේ සඳහා බදු අය කරනු ලබන්නේ අදාළ ඉඩම් කොටසටද; නොඑසේ නම්, ව්‍යාපාරිකයන් තම වියදමින් නිමකළ ගොඩනැගිලිවලටද යන්න සඳහන් කරන්නේද;

(iii) මෙම බදු අය කිරීමට අදාළව, බෞද්ධ කටයුතු කොමසාරිස්වරයා නිර්දේශ කර ඇති ලේඛන ඉදිරිපත් කරන්නේද;

(iv) මෙම ව්‍යාපාරික ස්ථානයක් වෙනත් පුද්ගලයෙකුට විකිණීමේදී ලැබෙන මුදලින් 25%ක් අදාළ විහාරස්ථානය වෙත ගෙවිය යුතු බවට බෞද්ධ කටයුතු කොමසාරිස්වරයාගේ නියමයක් තිබේද;

(v) එසේ නම්, තම පෞද්ගලික මුදලින් නිමකළ විශාල ගොඩනැඟිලි සමඟ තම ව්‍යාපාර ස්ථාන විකිණීමේදී ඔවුන්ට විශාල අසාධාරණයක් සිදුවන බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1630/'17

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සූර්ය බලයෙන් විදුලිය උත්පාදනය කිරීම මේ වනවිට ලෝකයේ පවතින නිෂ්පාදන වියදම අඩුම පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රය බව පිළිගන්නේද;

(ii) එසේ නම්, සූර්ය බලයෙන් විදුලිය උත්පාදනය කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

(iii) 2016.09.06 දින රජය විසින් දියත් කරන ලද "සූර්ය බල සංග්‍රාමය" නමැති වැඩසටහන මඟින් මේ වනවිට ජාතික විදුලි පද්ධතියට එකතු කර ඇති විදුලිබල ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1636/'17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සීමාසහිත ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම (Lanka Coal Company (Pvt.) Ltd.) පිහිටුවීමේ අරමුණු කවරේද;

(ii) එම සමාගමේ මේ වනවිට සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමාගමේ සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය කවුරුන්ද;

(iv) 2016 ජූලි මාසයට අදාළව, එම සමාගමේ සභාපතිවරයා, අධ්‍යක්ෂ මණ්ඩලය සහ සේවකයන් විසින් ලබාගෙන ඇති වැටුප් සහ සියලු දීමනා කවරේද;

(v) එකී සමාගම පිහිටුවීමෙන් අපේක්ෂා කළ අරමුණු ඉටු වී තිබේද;

(vi) ගල් අඟුරු මිලදී ගැනීම වැනි බරපතල ව්‍යාපාරික කටයුත්තක් සිදු කිරීමට එකී සමාගමට හැකියාව තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 නොවැම්බර් මස 22 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

116/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බාහිර සිසුන් සඳහා ප්‍රථම උපාධි පාඨමාලා පවත්වන ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්ව විද්‍යාල කවරේද;

(ii) එම විශ්වවිද්‍යාල පවත්වන එවැනි පාඨමාලා එක් එක් විශ්වවිද්‍යාලය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) දැනට බාහිර උපාධිය සඳහා ලියාපදිංචි සිසුන් ප්‍රමාණය, එක් එක් විශ්වවිද්‍යාලය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත විශ්වවිද්‍යාලවල බාහිර උපාධි හැදෑරීම සඳහා අවසන් වරට සිසුන් ලියාපදිංචි කළ දිනය එක් එක් විශ්වවිද්‍යාලය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සිසුන් ලියාපදිංචි කිරීම ක්‍රමවත් කාල ප්‍රාන්තරයක් අනුව සිදු නොකිරීමට හේතු කවරේද;

(iii) ප්‍රථම බාහිර උපාධිය සඳහා සිසුන් ලියාපදිංචිය සීමා කිරීමට කටයුතු කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1215/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් වර්ෂ 1983 න් පසුව විනාශ කරන ලද රාජ්‍ය ආයතන සංඛ්‍යාව කොපමණද;

(iii) විනාශ වූ එම දේපළ පිළිබඳව රජයේ පිළිගත් තක්සේරුවක් කර තිබේද;

(iv) එසේ නම්, එම දේපළවල සම්පූර්ණ වටිනාකම කොපමණද;

(v) විනාශ කරන ලද එක් එක් දේපළවලට, වගකිව යුතු ත්‍රස්තවාදීන්ට විරුද්ධව නීතිමය පියවර ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පියවර කවරේද;

(vii) ඉහත (i) - (vi) දක්වා විමසා ඇති තොරතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1420/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 187 යෝජනාවෙන් හඳුන්වාදීමට යෝජනා කරන ලද ඩිජිටල් හැඳුනුම්පතෙහි දළ සැලැස්ම ඉදිරිපත් කරන්නේද;

(ii) එම හැඳුනුම්පත නිකුත් කිරීමේ බලධාරියා කවුරුන්ද;

(iii) පුරවැසියන්ට හැඳුනුම්පත් ලබාදීම වෙනුවෙන් ඇස්තමේන්තු පිරිවැය කොපමණද;

(iv) එම පිරිවැය දරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(v) 2017 වර්ෂය තුළදී ඩිජිටල් හැඳුනුම්පත් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය අයවැයෙන් වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1512/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016.12.31 දිනට රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයන්හි මුළු සේවා නියුක්තිය කොපමණද;

(ii) 2016.12.31 දිනට රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයන්හි සේවා නියුක්තිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2016.12.31 දිනට රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයන්හි සේවා නියුක්තිය ස්ත්‍රී/පුරුෂ සමාජභාවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2014.12.31 සහ 2015.12.31 දිනට සාපේක්ෂව, 2016.12.31 දිනට රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය අංශයන්හි සේවා නියුක්තිය ඉහළ ගොස් ඇති ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1583/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට, රුවන්පුර සුනාමි නිවාස සංකීර්ණයේ, මයුරපුර, රුවන්පුර, අංක 35 දරන නිවස එස්. එම්. සිජාවුදීන් මහතාට ලබාදුන්නේද;

(ii) එසේ නම් , එම දිනය කවරේද;

(iii) ඔහු, එම නිවසේ කොපමණ කාලයක් පදිංචිව සිටියේද;

(iv) මේ වනවිට එම නිවසේ පදිංචිව සිටින්නේ කවුරුන්ද;

(v) ඉහත පුද්ගලයාගෙන් එම නිවස බලහත්කාරයෙන් පැහැරගෙන ඇති බව දන්නේද;

(vi) 2010 දෙසැම්බර් මාසයේදී, මේ සම්බන්ධයෙන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම්වරයාට ඉදිරිපත් කළ පැමිණිල්ල සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1622/'17

ගරු හේෂාන් විතානගේ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ සීනි අවශ්‍යතාවය සපුරාලීමේදී සෙවනගල සීනි කර්මාන්තශාලාව ඉතා වැදගත් වන බවත්;

(ii) එමඟින් විශාල වක්‍ර හා ඍජු රැකියා අවස්ථා සංඛ්‍යාවක් බිහිවී ඇති බවත්;

(iii) දැනට මෙම කර්මාන්තශාලාව ආශ්‍රිතව ලබා දී ඇති ඉඩම්වල ගොවීන් උක් වගා නොකර වෙනත් වගාවන් සඳහා යොමු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සෙවනගල සීනි කර්මාන්තශාලාව ආශ්‍රිතව උක් වගාව සඳහා ගොවීන් වෙත වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(ii) දැනට උක් වගාව සිදු කරන ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් කොපමණද;

(iii) දිනෙන් දින උක් ගොවියා වෙනත් වගාවන් සඳහා යොමු වීමෙන් එම කර්මාන්තශාලාවෙන් අපේක්ෂිත නිෂ්පාදනය ලබා ගැනීමට නොහැකි විය හැකි බව පිළිගන්නේද;

(iv) එසේ නම්, මෙම කර්මාන්තශාලාවෙන් වැඩි නිෂ්පාදනයක් ලබා ගැනීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1632/'17

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදුලිය පිළිබඳ ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණය (Demand Side Management) පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතු බව පිළිගන්නේද;

(ii) විදුලිය පිළිබඳ ඉල්ලුම් පාර්ශ්වීය කළමනාකරණය පිළිබඳව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන කවරේද;

(iii) එකී වැඩසටහන මෙතෙක් ලබා ඇති ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1641/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය මාස කිහිපයේ සිට රටේ පවතින දැඩි නියඟය හේතුවෙන් ගොවීන් දැඩි පීඩාවට ලක් වූ බව පිළිගන්නේද;

(ii) එම නියඟය නිසා දැඩි හානියට පත් දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ගොවිජන සේවා කලාප වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එසේ පීඩාවට පත් වූ ගොවීන් වෙනුවෙන් කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් යම් වන්දි ගෙවීමක් සිදු කර තිබේද;

(iv) එසේ නම්, එම ගොවීන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) නියඟය නිසා පීඩාවට පත් වූ ගොවීන් සඳහා වන්දි ලබාදීම කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය හරහා ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 නොවැම්බර් මස 23 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

118/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙහිවල සත්වෝද්‍යානයේ සතුන්ට ප්‍රතිකාර කිරීමට අවශ්‍ය පහසුකම් අවම මට්ටමක පවතින බවත්;

(ii) පශු වෛද්‍යවරුන්ගේ හිඟයක් ඇති බවත්;

(iii) සතුන් කිහිප දෙනෙකු මෙම තත්ත්වය තුළ මිය ගොස් ඇති බවත්;

(iv) තවත් සතුන් කිහිප දෙනෙකු රෝගාතුරව සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) 2013.01.01 සිට 2015.06.30 දක්වා කාලය තුළ දෙහිවල සත්වෝද්‍යානය තුළදී, මියගිය සතුන්ගේ වර්ගය, වයස හා මිය යෑමට හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දෙහිවල සත්වෝද්‍යානයට අනුයුක්තව සිටිය යුතු අවම පශු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට දෙහිවල සත්වෝද්‍යානයේ සේවය කරන පශු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) දෙහිවල සත්වෝද්‍යානයේ සතුන්ගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීමට ගන්නා පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1202/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වවුනියාව දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේදී යුදමය තත්ත්වය නිමවන තෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1405/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 176ට අනුව, විසිතුරු මත්ස්‍ය කර්මාන්ත ව්‍යාපාර ඇරඹීම සඳහා සහනදායී පදනමින් ණය පහසුකම් ලබාදුන් පුද්ගලයන්ගේ හෝ ආයතනවල ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(ii) වර්ෂ 1977 සිට මේ දක්වා විසිතුරු මත්ස්‍ය අපනයන මඟින් ඉපයූ විදේශ විනිමය ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ විසිතුරු මසුන් අපනයනකරුවන්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iv) අයවැය යෝජනාවට අනුව, විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන්ට ණය පහසුකම් ලබා දීමේදී විශේෂයෙන් ලබාදුන් සහන කවරේද;

(v) 2017 වර්ෂය වෙනුවෙන් එකී සහන තවදුරටත් වලංගු වන්නේද;

(vi) විසිතුරු මසුන් අපනයන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වගකීම දරන රාජ්‍ය ආයතනයන්හි ක්‍රියාකාරිත්වය පිළිබඳව සෑහීමට පත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1637/'17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, පූනරීන් ප්‍රදේශයේ පුනර්ජනනීය බලශක්ති උද්‍යානයක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) එම පුනර්ජනනීය බලශක්ති උද්‍යානයෙන් නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත සූර්ය බලශක්ති ප්‍රමාණය කොපමණද;

(iii) එම බලශක්ති උද්‍යානය තුළ නිපදවීමට අපේක්ෂා කරන සුළං බලශක්ති ප්‍රමාණය කොපමණද;

(iv) එම ව්‍යාපෘතියේ ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1642/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඌව පළාතේ ඇති මුළු පන්සල් සංඛ්‍යාව සහ ඒවායේ වැඩවසන මුළු භික්ෂූන් වහන්සේලා සංඛ්‍යාව කොපමණද;

(ii) අධිරාජ්‍යවාදීන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් ඌව පළාතේ පන්සල් පද්ධතිය දැඩි බිඳ වැටීමකට ලක්වූ බව පිළිගන්නේද;

(iii) ඓතිහාසික වශයෙන් ඌව පළාතට සිදු වූ බරපතල අසාධාරණය හේතුවෙන් බිඳ වැටුනු පන්සල් පද්ධතිය යළි නඟා සිටුවීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1669/'17

ගරු අශෝක ප්‍රියන්ත මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාත් සභාව යටතේ පුත්තලම දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන විසින් අපද්‍රව්‍ය සහ කැළිකසළ බැහැර කරන ස්ථාන කවරේද;

(ii) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ව්‍යාපෘතියක් මෙම පළාත් පාලන ආයතන සඳහා හඳුන්වා දී තිබේද;

(iii) එසේ නම්, 2010 වර්ෂයේ සිට මේ දක්වා එම ව්‍යාපෘතිය සඳහා එක් එක් පළාත් පාලන ආයතනයකට ලබා දී ඇති පහසුකම් හා මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1675/'17

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා, — අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2008 දෙසැම්බර් මාසයේදී මඩකලපුව, කෝපායි සහ කොටගල යන ගුරු පුහුණු විද්‍යාලවලින් තම පුහුණුව නිමකර වන්නි දිස්ත්‍රික්කයේ පාසල්වලට පත්වීම් ලබාදෙන ලද සහ පුහුණුව අවසන් කළ වහාම විභාගය පැවැත්වීමේ ක්‍රියාපටිපාටියට පටහැනි ලෙස 2009 අප්‍රේල් මාසයේදී අවසන් විභාගයට පෙනී සිටින ලෙස ඉල්ලා සිටිනු ලැබූ අභ්‍යාසලාභීන්ගේ නම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කී දිස්ත්‍රික්කය තුළ යුද්ධය උච්චතම අවස්ථාවට එළඹ තිබූ හෙයින් එම අභ්‍යාසලාභීන්හට දිස්ත්‍රික්කයෙන් පිටතට පැමිණීමට නොහැකි වූ බවත්;

(ii) ඔවුන් තම කණිෂ්ඨ කණ්ඩායම සමඟ විභාගයට මුහුණදුන් අතර එම කණිෂ්ඨ කණ්ඩායමට ලබාදුන් ප්‍රශ්න පත්‍රයටම පිළිතුරු ලබා දුන් නමුත්, කණිෂ්ඨ කණ්ඩායම සඳහා තම සහතිකය වලංගු වන දිනය ලෙස 2009.08.01 දින ලබාදුන් අතර ඔවුන්ගේ සහතිකය වලංගු වන දිනය 2011.01.01 ලෙස වෙනස් දිනයක් ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) කණිෂ්ඨ කණ්ඩායමේ සහතිකය වලංගු වන දිනයම ඔවුන්හට ලබාදීමට පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1693/'17

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ මුළු සංඛ්‍යාව කොපමණද;

(ii) සභාපතිවරයාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ මාසික වැටුප් හා දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සභාපතිවරයාගේ නම කුමක්ද;

(iv) ඉහත තනතුර දැරීමට ඔහු සපුරා ඇති අධ්‍යාපන සුදුසුකම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2017 නොවැම්බර් මස 24 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

119/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013.06.30 දින සිට 2015.06.30 දින දක්වා කාලය තුළ විනය ක්‍රියාමාර්ග ලෙස ශිෂ්‍යභාවය අහෝසි කළ, පන්ති තහනම් කළ හා අධිකරණ ක්‍රියාමාර්ග ගත් විශ්වවිද්‍යාල සිසුන් සංඛ්‍යාව විශ්වවිද්‍යාලය අනුව;

(ii) එම එක් එක් ශිෂ්‍යයාගේ නම, ලිපිනය හා දුරකථන අංකය විශ්වවිද්‍යාලය අනුව;

(iii) උක්ත ශිෂ්‍යයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට හේතුව එක් එක් ශිෂ්‍යයා අනුව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශිෂ්‍ය අරගල සඳහා විසඳුම විනය ක්‍රියාමාර්ග නොවන බවත්;

(ii) ශිෂ්‍ය ඉල්ලීම් සම්බන්ධව සාවධානව කන් දිය යුතු බවත්;

(iii) විශ්වවිද්‍යාලයන්හි පහසුකම් වැඩි කළ යුතු බවත්;

(iv) ශිෂ්‍යයන්ගේ අනාගත රැකියා අපේක්ෂාව සුරක්ෂිත කළ යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) විශ්වවිද්‍යාල තුළ ඇති වන ශිෂ්‍ය අරගල අවම කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේනම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම ක්‍රියාමාර්ග හරහා ශිෂ්‍ය අරගල අවම වී තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1203/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකලපුව දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වනවිට තිබූ,

(i) වාරිමාර්ග සංඛ්‍යාව;

(ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;

(iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේදී යුදමය තත්ත්වය නිමවන තෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;

(ii) යුදමය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල;

එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1639/'17

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නෝබල් රිසෝසස් ලිමිටඩ් නමැති සමාගම විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත වරින් වර සපයා ඇති මුළු ගල් අඟුරු ප්‍රමාණය කොපමණද;

(ii) එම ගල් අඟුරු වෙනුවෙන් ඉහත සමාගමට ගෙවා ඇති සම්පූර්ණ මුදල කොපමණද;

(iii) එම සමාගම විසින් නිසි වෙලාවට ගල් අඟුරු සැපයීමට අසමත් වීම හේතුවෙන් නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ක්‍රියාකාරිත්වය අත්හිටුවීමට සිදු වූ කාලය කොපමණද;

(iv) එසේ විදුලි ජනක යන්ත්‍ර අත්හිටුවීම නිසා ලංකා විදුලිබල මණ්ඩලයට සිදුවී ඇති පාඩුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නෝබල් රිසෝසස් ලිමිටඩ් ආයතනය විසින් ලබාගෙන ඇති අංක LCC/09/T/02, LCC/01 සහ LCC/13/T/01 දරන ටෙන්ඩරවලට අදාළව ශ්‍රී ලංකාවේ දේශීය නියෝජිතයන් වෙන් වෙන් වශයෙන් කවුරුන්ද;

(ii) ප්‍රසම්පාදන කාර්යය පටිපාටිය නොතකා ඉහත කී ගල් අඟුරු සැපයීම් එකී සමාගමට ලබාදීමට හේතුව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1646/’17

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති අධ්‍යාපන කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් අධ්‍යාපන කොට්ඨාසයේ නම කවරේද;

(iii) එම එක් එක් අධ්‍යාපන කොට්ඨාසයේ පිහිටි ජාතික පාසල් හා පළාත් පාසල් සංඛ්‍යාව සහ එම එක් එක් පාසලේ නම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් පාසලේ සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව හා ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම එක් එක් අධ්‍යාපන කොට්ඨාසයේ පවතින ගුරු හිඟය විෂය පදනමින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එසේ ගුරු පුරප්පාඩු පවතින අධ්‍යාපන කොට්ඨාසවල ගුරු හිඟය අවම කිරීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1684/’17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) ඒ සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් නිවේදනයේ පිටපතක් සභාගත කරන්නේද;

(iii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් ආවරණය වන සම්පූර්ණ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එහි ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව කොපමණද;

(v) එම ග්‍රාම නිලධාරි වසම්වල අංකයන් හා නාමයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිහිටුවීමේදී, නිල වශයෙන් සීමා නිර්ණය කිරීමක් සිදුවී තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව විස්තර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරි වසම් අතරින් කිසියම් වසමක/වසම්වල පරිපාලන කටයුතු හෝ මෙහෙයවීම් වෙනත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ග්‍රාම නිලධාරි වසම්වල නම්, අංකයන් ඇතුළු විස්තර ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1690/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2000.05.05 දිනැති අංක 1130/22 දරන ගැසට් නිවේදනය මඟින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, කොන්දේසි සහිතව නකල්ස් කඳු වැටිය සඳහා ලෝක උරුම තත්ත්වය ලැබුණු බවත්;

(ii) ඉහත කොන්දේසිවල ප්‍රධාන කොන්දේසිය ප්‍රකාරව, නකල්ස් කඳුවැටියට ඉතා ආසන්නව පිහිටි මීනිපේ, පන්විල, පාතදුම්බර, ලග්ගල, විල්ගමුව, රත්තොට, උකුවෙල හා මාතලේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 8ට අයත් අක්කර 2000ක විශාලත්වයෙන් යුත් භූමි ප්‍රමාණයක් උක්ත කඳුවැටිය සමඟ ඒකාබද්ධ කර නොමැති බවත්;

(iii) එබැවින්, නකල්ස් කඳුවැටිය ලෝක උරුම තත්ත්වයෙන් ඉවත්කිරීමේ අවදානමකට ලක්ව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නකල්ස් කඳුවැටිය ලෝක උරුම තත්ත්වයෙන් ඉවත්කිරීම වළක්වා ගැනීම සඳහා ඉහත සඳහන් අක්කර 2000ක භූමි ප්‍රමාණය නකල්ස් කඳු වැටිය සමඟ ඒකාබද්ධ කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1695/'17

ගරු මොහොමඩ් නවවි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 වර්ෂයේදී පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය ප්‍රාදේශීය සභාව, නොරොච්චෝලෙයි ගම්මානය තුළ ළමා උද්‍යානයක් පිහිටුවීමට අනුමතිය ලබා දී තිබේද;

(ii) එසේ නම්, එබඳු ළමා උද්‍යානයක් පිහිටුවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම කාර්යය සඳහා කොපමණ මුදලක් ලැබී තිබේද;

(ii) එම මුදල් ලැබී ඇත්තේ කා වෙතද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1697/’17

ගරු බිමල් රත්නායක මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ “ගූගල් ලූන්” ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ගූගල් සමාගම හා ශ්‍රී ලංකා රජය අතර ඇතිකර ගත් ගිවිසුමක් හෝ එකඟතා ලියවිල්ලක් තිබේද;

(ii) මේ සඳහා ගූගල් සමාගම තෝරා ගැනීමට රජය තීරණය කළ පදනම කවරේද;

(iii) එම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය ලබාදීමට එකඟ වූ හා ලබාදුන් පහසුකම් කවරේද;

(iv) එම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජයට වැය වූ මුදල කොපමණද;

(v) ගූගල් සමාගම ගුවන්ගත කළ බැලූනය කඩා වැටීමට බලපෑ හේතුව කවරේද;

(vi) ඒ පිළිබඳ පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් නිකුත් කර තිබේද;

(vii) ගූගල් සමාගම මෙම ව්‍යාපෘතිය අතහැර ඇති බවට ප්‍රකාශ කර තිබේද;

(viii) එසේ නම්, අදාළ ගිවිසුම හා එකඟතා කඩවීම හේතුවෙන් ඇති වූ මූල්‍යමය හා අනිකුත් හානි කවරේද;

(ix) එම හානිවල වගකීම පැවරෙන්නේ කාහටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 නොවැම්බර් මස 25 වැනි සෙනසුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

892/’16

ගරු බුද්ධික පතිරණ මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුලා වෙල්ලිය ග්‍රාමය ආශ්‍රිතව දිවි ගෙවන “වන්නි සිංහල” නම්, ජන වර්ගය පිළිබඳව සමීක්ෂණයක් කර තිබේද;

(ii) උක්ත ග්‍රාමයට අමතරව මෙම ජන වර්ගය ජීවත්වන වෙනත් ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(iii) යුද සමයේදී විවිධ පීඩාවන්ට ලක්වූ මෙම ජනතාව දිවිගෙවන ගම්මානයන්හි මූලික අවශ්‍යතා අවම මට්ටමක පවතින බව පිළිගන්නේද;

(iv) එම පහසුකම් කඩිනමින් ලබා දීමට පියවර ගෙන තිබේද;

(v) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) මෙම ජනතාවගේ සාම්ප්‍රදායික උරුමයන් ආරක්ෂා කිරීමට රජය පියවර ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1228/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1421/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 189 යෝජනාවට අනුව, විශේෂ අරමුණු සඳහා වන සමාගමක් (Special Purpose Company) පිහිටවනු ලැබුවේද;

(ii) එසේ නම්, එම සමාගම කවරේද;

(iii) උක්ත සමාගමෙහි සාංගමික සංස්ථා පත්‍රයෙහි සඳහන් වන අරමුණු කවරේද;

(iv) එම සමාගමෙහි සාංගමික ව්‍යවස්ථාවලියෙහි ප්‍රධාන නියමයන් කවරේද;

(v) උක්ත සමාගමෙහි අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1647/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඌව පළාත් සභාව විසින් ඉඩම් ඔප්පු ලබාදීමේ වැඩසටහනක් දියත් කර තිබේද;

(ii) එසේ නම්, වත්මන් ඌව ප්‍රධාන අමාත්‍යවරයා එම ධූරයට පත්වීමෙන් අනතුරුව මේ දක්වා ලබා දී ඇති ඔප්පු සංඛ්‍යාව කොපමණද;

(iii) ඔප්පු ලබා දී ඇති පුද්ගලයන්ගේ නම්, ලිපිනයන් සහ ඔවුන් පදිංචි ග්‍රාම නිලධාරි වසම් කවරේද;

(iv) මෙම ඉඩම් ඔප්පු ලබාදීමට පළාත් සභාව අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1730/’17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය මඟින් යෝජනා කළ පරිදි තම ජීවිතයේ සැඳෑ සමය ගෙවන කලාකරුවන් වෙනුවෙන් දායක විශ්‍රාම වැටුප් ක්‍රමයක් මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා දායක වී ඇති කලාකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2016 හා 2017 වර්ෂවලදී රජය මඟින් මේ සඳහා වෙන් කළ මුදල, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1732/’17

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත් තුළ පිහිටි එක් එක් අධ්‍යාපන කලාපයට අයත් මුස්ලිම් පාසල් සංඛ්‍යාව කවරේද;

(ii) ඉස්ලාම්, ඉස්ලාම් අධ්‍යයනය සහ අරාබි ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය සිදු කරන සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ (ඉස්ලාම්) නම් කවරේද;

(iii) සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් (ඉස්ලාම්) නොමැති අධ්‍යාපන කලාපවල නම් කවරේද;

(iv) මෙම කලාපවල ඉහත කී විෂයයන් ඉගැන්වීම අධීක්ෂණය කිරීමේ කාර්යය පවරනු ලැබ ඇති අධීක්ෂකවරුන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය (විශේෂ කාණ්ඩය - ඉස්ලාම්) සඳහා පුරප්පාඩු දෙකක් පමණක් ගැසට් නිවේදනය තුළ පළ කරන ලද බවත්;

(ii) විෂයමාලාව තුළ ආගමික අධ්‍යාපනය අනිවාර්ය බවත්;

(iii) ඉස්ලාම් ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය නොකිරීම, මුස්ලිම් ශිෂ්‍යයන්ගේ ආගමික අධ්‍යාපනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයෙහි (විශේෂ කාණ්ඩය - ඉස්ලාම්) සේවක සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගනු ලබන්නේද;

(ii) නොඑසේ නම්, වැඩබලන පදනම මත සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් (ඉස්ලාම්) පත් කිරීමට පියවර ගනු ලබන්නේද;

(iii) එසේ නම්, එය සිදු කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1758/’17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලාංකිකයන් විසින් ලෝකයේ විවිධ රටවල පවත්වාගෙන යන බැංකු ගිණුම් පිළිබඳව පාර්ලිමේන්තුවේදී 2016 ජූලි මස 05 වැනි දින මවිසින් විමසූ බවත්;

(ii) එම ප්‍රශ්නයට අදාළ සියලු තොරතුරු සොයා බලා මෙම සභාවට දන්වන බවට පොරොන්දු වූ බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ප්‍රශ්නය අසා මේ වනවිට සෑහෙන කාලයක් ඉක්ම ගොස් තිබුනද, එයට අදාළ පිළිතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වී ඇති බව පිළිගන්නේද;

(ii) ලෝකයේ විවිධ රටවල ශ්‍රී ලාංකිකයන් විසින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් පිළිබඳ පූර්ණ වාර්තාවක් ලබාගැනීමට රජය, රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් ක්‍රියා කරනු ලැබුවේද;

(iii) නොඑසේ නම්, ඒ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1980/'17

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ, තිරියාය පිහිටි ලොව ප්‍රථම බෞද්ධ චෛත්‍යය ලෙස සැළකෙන ගිරිහඬු සෑය පූජා භූමිය වෙනුවෙන් වෙන් කරන ලද ඉඩම් මැනීම අවසන් කර තිබේද;

(ii) එසේ නම්, එකී පූජාභූමිය ප්‍රකාශයට පත් කිරීම සඳහා වූ ගැසට් නිවේදනය ප්‍රමාද වීමට හේතු කවරේද;

(iii) දැනට ගිරිහඬු සෑය පූජා භූමිය සඳහා වෙන්කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) ගිරිහඬු සෑය පූජා භූමිය සංවර්ධනය උදෙසා ඔබ අමාත්‍යාංශය මඟින් ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 නොවැම්බර් මස 27 වැනි සඳුදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

685/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ආහාරය සඳහා ගන්නා බිත්තර වර්ග මොනවාද;

(ii) එම බිත්තරවල වාර්ෂික අවශ්‍යතාවය වෙන් වෙන්ව දළ වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව බිත්තර ආනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම බිත්තර වර්ග කවරේද;

(iii) 2016 වර්ෂය තුළ ආනයනය කළ බිත්තර ප්‍රමාණය, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) බිත්තර ආනයනය සඳහා 2016 වර්ෂයේදී වැය වූ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකාව බිත්තර අපනයනය කරන්නේද;

(ii) එසේ නම්, එම බිත්තර වර්ග කවරේද;

(iii) 2016 වර්ෂය තුළ අපනයනය කළ බිත්තර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) 2016 වර්ෂයේදී බිත්තර අපනයනයෙන් ශ්‍රී ලංකාව ලද ආදායම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1229/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1422/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 191ට අනුව, ස්මාට් ඩිජිටල් පන්ති කාමර 200 ආරම්භ කළ පාසැල්වල නම් කවරේද;

(ii) 2016 වර්ෂයේදී මෙම පංති කාමර 200 සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදාහළ මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) 2017 වර්ෂයේදී ඉහත දැක්වූ පන්ති කාමර 1000 ක් නිර්මාණය කිරීම සඳහා දැනට තෝරාගෙන ඇති පාසැල්වල නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iv) දැනට වඩාත් හොඳින් ඩිජිටල් ස්මාට් පංති කාමර ක්‍රියාත්මක වන පාසැල් කවරේද;

(v) එම පාසැල්වල මෙම දියුණු තාක්ෂණික පහසුකම් සඳහා උපදේශාත්මක සහාය ලබා දෙනු ලබන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1648/'17

ගරු වජිරා ... 

(අ) (i) රත්මලාන වෘත්තීය පුහුණු විශ්වවිද්‍යාලයේ දැනට ක්‍රියාත්මක වන පීඨ සහ දෙපාර්තමේන්තු කවරේද;

(ii) එම එක් එක් පීඨය මගින් පවත්වනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) දැනට මෙහි සේවයේ නියුතු අධ්‍යයන හා අනධ්‍යයන සේවක සංඛ්‍යාව, එක් එක් දෙපාර්තමේන්තුව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම විශ්වවිද්‍යාලයේ පවතින සේවක පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1786/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධිකරණ අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990.12.31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ කටයුතු කරමින් සිටි ක්වාසි විනිසුරුවරුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) එම ක්වාසි අධිකරණ කලාප මගින් ආවරණය වන ග්‍රාම නිලධාරි වසම් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iii) එම ක්වාසි අධිකරණ කලාප ප්‍රකාශයට පත්කරන ලද ගැසට් පත්‍ර අංක හා නිවේදන කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1813/'17

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි රජයට අයත් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ඉඩම්වලින් බදු දී ඇති ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම්, බදුගත් ආයතනය, බදුගත් දිනය, බදු කාලය සහ බදු මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ඉඩම් සඳහා හිඟ බදු ගෙවීමට ඇති ආයතන කවරේද;

(v) එක් එක් ආයතනයෙන් ගෙවීමට ඇති හිඟ බදු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1862/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මහානගර සැලසුම (Megapolis Plan) යටතේ 2017 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 03 ක් දක්වා සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් කවරේද;

(ii) දැනටමත් යම් වැඩසටහන් ආරම්භ කර ඇත්නම්, ඒවා කවරේද;

(iii) ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් නිශ්චිත වශයෙන් පටන් ගන්නා දින වකවානු කවරේද;

(iv) මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනටමත් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) දැනට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ සඳහා ණය මුදල් ලබා ගන්නේද;

(iv) එසේ නම්, ණය ලබා ගන්නා ආයතන සහ ණය ප්‍රමාණය කොපමණද;

(v) නොඑසේ නම්, රජය විසින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1992/'17

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා,— කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ප්‍රාදේශීය වැවිලි සමාගම් වත්මන් සාමූහික ගිවිසුමේ ක්‍රියාපටිපාටියට පටහැනිව 'අවුට් ග්‍රෝවර්' (Out-grower) නමැති ක්‍රමයක් වතු පරිපාලනය තුළ ක්‍රියාත්මක කරමින් සිටින බව එතුමා දන්නේද?

(ii) එසේ නම්, ඉහත (අ)හි සඳහන් ක්‍රමය ක්‍රියාත්මක වන ප්‍රදේශීය වැවිලි සමාගම් කවරේද;

(iii) ඒවා නීතියට යටත්ව හෝ සාමූහික ගිවිසුමට එකඟව ක්‍රියාත්මක වන්නේද;

(iv) අනාගතයේදී 'අවුට් ග්‍රෝවර්' ක්‍රමය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 නොවැම්බර් මස 28 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

686/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රහල් තෙදස් මිත්‍රත්ව සංසදය විසින් මාතර, කොටුවේගොඩ වෙළඳ තීරයේ ඉදිකරන ලද ළමා උද්‍යානයේ උපකරණ 2013.03.07 වැනි දින රාත්‍රියේ අතුරුදන්ව ඇති බවත්;

(ii) මෙතෙක් එම උපකරණ සොයාගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම සිදුවීමට අදාළ පරීක්ෂණයක් සිදු කරන්නේද;

(ii) එසේ නම්, එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

(iii) පරීක්ෂණ කඩිනම් කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1230/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1423/’16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උසස් ඩිජිටල්කරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2016 අයවැයෙහි අංක193 යෝජනාවට අනුව වෙන්කළ රුපියල් මිලියන 10,000ක මූල්‍ය ප්‍රතිපාදය 2016 වර්ෂය තුළදී උපයෝජනය කළ ආකාරය ඉදිරිපත් කරන්නේද;

(ii) උක්ත අයවැය යෝජනාවෙන් ප්‍රතිලාභ හිමිකරගත් තැනැත්තන් හෝ ආයතනවල නාමලේඛනයක් හා ලබාගත් මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය පිළිබඳ විස්තර වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) 2016 අයවැය වෙන්කිරීම වූ රුපියල් මිලියන 10,000 ක මුදලින් වැය කළ නොහැකිවූ මුදල් ප්‍රමාණය, 2017 වර්ෂයේදී උපයෝජනය කර ගනු ලබන්නේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1649/’17

ගරු චමින්ද විජේසිරි මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 වර්ෂයේ සිට මේ දක්වා යල හා මහ කන්නවල,

(i) වී අස්වැන්න;

(ii) වී නිෂ්පාදනයෙන්, වී අලෙවි මණ්ඩලය මිලදී ගත් වී ප්‍රමාණය;

(iii) වී අලෙවි මණ්ඩලයෙන් සහල් මෝල් හිමියන්ට වී විකුණා තිබේ නම්, එම වී මිලදී ගත් පුද්ගලයන්ගේ නම් හා වී කිලෝවක විකුණුම් මිල;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) දැනට වී අලෙවි මණ්ඩලය ආරක්ෂිත තොගයක් ලෙස පවත්වාගෙන යනු ලබන වී තොග ප්‍රමාණය කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1794/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990.12.31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ කටයුතු කරමින් සිටි මුස්ලිම් විවාහ රෙජිස්ටාර්වරුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) එම විවාහ රෙජිස්ටාර් කොට්ඨාස මඟින් ආවරණය වන ග්‍රාම නිලධාරි වසම් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම රෙජිස්ටාර් කොට්ඨාස ප්‍රකාශයට පත්කරන ලද ගැසට් පත්‍ර අංක හා නිවේදන සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1863/'17

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන මහානගර සැලසුම (Megapolis Plan) යටතේ 2017 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 03 ක් දක්වා කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා සැලසුම් කර ඇති සංවර්ධන වැඩසටහන් කවරේද;

(ii) දැනටමත් යම් වැඩසටහන් ආරම්භ කර ඇත්නම්, ඒවා කවරේද;

(iii) ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් නිශ්චිත වශයෙන් පටන් ගන්නා දින වකවානු කවරේද;

(iv) මේ සඳහා රාජ්‍ය හා පෞද්ගලික ආයෝජන සිදු කරන්නේද;

(v) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දැනටමත් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට බලාපොරොත්තු වන වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) දැනට වැය කර ඇති මුදල කොපමණද;

(iii) මේ සඳහා ණය මුදල් ලබා ගන්නේද;

(iv) එසේ නම්, ණය ලබා ගන්නා ආයතන සහ ණය ප්‍රමාණය කොපමණද;

(v) නොඑසේ නම්, රජය විසින් වෙන් කර ඇති මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1957/'17

ගරු කනක හේරත් මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුඩා දරුවන් සිටින ශ්‍රී ලාංකික කාන්තාවන්ට, ගෘහ සේවය සඳහා විදෙස් ගතවීමට අවසර ලබාදී තිබූ වයස් සීමාව කොපමණද;

(ii) 2017/01/16 දිනැති පවුල් පසුබිම් වාර්තා ලබා දීමේ චක්‍රලේඛය අනුව, එම වයස් සීමාව කොපමණද;

(iii) ඉහත චක්‍රලේඛය අනුව මේ සඳහා ස්වාමි පුරුෂයාගේ අවසරය ලබාගැනීමේ අවශ්‍යතාවය ඉවත් කර තිබේද;

(iv) ඉහත චක්‍රලේඛය අනුව අනාරක්ෂිත හා ආබාධිත දරුවන් සිටින කාන්තාවන්ට විදෙස් ගෘහසේවයට යාමට හැකියාව ලැබීම එම දරුවන්ගේ ආරක්ෂාවට තර්ජනයක් නොවන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1993/'17

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේදී ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් මන්නාරම දිස්ත්‍රික්කයේ, පුදුකුඩියිරුප්පු, උප්පුක්කුලම් - අල්පතා, කරිසල්, තලෙයිමන්නාරම හා කාට්ටාස්පත්තිරි යන ක්‍රීඩාංගණ සඳහා රුපියල් මිලියනය බැගින් මුදල් වෙන්කර තිබේද;

(ii) 2016 වර්ෂයේදී ක්‍රීඩාංගණ සඳහා මුදල් වෙන්කිරීමේදී මන්නාරම අල් අසාර් මහා විද්‍යාල ක්‍රීඩාංගණයට රුපියල් මිලියන දෙකක්, මන්නාරම එරුක්කලම්පිටි මහා විද්‍යාල ක්‍රීඩාංගණයට රුපියල් මිලියන තුනක්, කාට්ටාස්පත්තිරි ක්‍රීඩාංගණයට රුපියල් මිලියනයක් වශයෙන් වෙන් කර තිබේද;

(iii) 2017 වර්ෂයේදී ක්‍රීඩාංගණ සඳහා මුදල් වෙන්කිරීමේදී, මන්නාරම එරුක්කලම්පිටි පාසැලේ ක්‍රීඩාංගණය සඳහා රුපියල් මිලියන 05ක් වෙන් කිරීමේ පදනම කවරේද;

(iv) මෙම මුදල් වෙන්කිරීම් එක්තරා ජන වර්ගයකට පමණක් වාසිදායක වන ආකාරයෙන් සිදු කර ඇති බව පිළිගන්නේද;

(v) එසේ නම්, අනාගතයේදී මෙසේ පක්ෂග්‍රාහීව සිදු කරනු ලබන මුදල් වෙන්කිරීම් නවත්වා සැමට සමානව මුදල් වෙන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 නොවැම්බර් මස 29 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

687/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව සතුව පවතින අබලි වාහන පිළිබඳ සංගණනයක් කර තිබේද;

(ii) එසේ නම්, එම වාහනවල මුළු වටිනාකම කොපමණද;

(iii) නොඑසේ නම්, සංගණනයක් සිදු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පොලිස් දෙපාර්තමේන්තුව සතු අබලි වාහන අවසන් වරට වෙන්දේසි කළ දිනය කවරේද;

(ii) එම වෙන්දේසියෙන් ලැබූ ආදායම කොපමණද;

(iii) නැවත වෙන්දේසියක් සිදු කරන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1231/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වව්නියාව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථාන අතරින් දැනට සංරක්ෂණ කටයුතු සිදුකරනු ලබන ස්ථාන කවරේද;

(iii) ඒ සඳහා 2015 හා 2016 වර්ෂවලදී වෙන් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් විනාශ කරන ලද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කවරේද;

(v) එම විනාශයන් පිළිබඳව තක්සේරුවක් කර ඇත්නම්, තක්සේරු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම විනාශයන් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන තිබේද;

(vii) ඉහත සියල්ලෙහිම පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1425/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 200 යෝජනාවට අනුව අපනයන සැකසුම් කලාප නවීකරණය සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද;

(ii) අප රටෙහි දැනට ක්‍රියාත්මක අපනයන සැකසුම් කලාපයන්හි ප්‍රගතිය කවරේද;

(iii) නව අපනයන සැකසුම් කලාප ඇරඹීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මැදිහත් වී සිටින්නේද;

(iv) වර්ෂ 2000 සිට 2016 දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි කාර්ය සාධනය කවරේද;

(v) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි අධ්‍යක්ෂවරුන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1650/'17

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය දා පැවැත්වූ විදුහල්පති සේවයේ III වැනි පංතියට බඳවා ගැනීමේ විභාගයෙන් සමත් වූ පිරිස අතරින් විදේශ පුහුණුව සඳහා තෝරාගත් සංඛ්‍යාව කොපමණද;

(ii) විදේශ පුහුණුව සඳහා බඳවා ගත් අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) විදේශ පුහුණුව සඳහා තෝරා ගැනීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(iv) විශාල වියදමක් දරා විභාග පවත්වා, පුහුණුවක් ලබාදුන් මෙම පිරිස මෙතෙක් විධිමත් ලෙස පළාත් සභා මඟින් ස්ථානගත කර නොමැති බව දන්නේද;

(v) මෙම ගැටලුව විසඳීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1795/'17

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1990.12.31 දින හෝ ඊට ආසන්න කාල වකවානුවේදී උතුරු පළාතේ, වව්නියාව දිස්ත්‍රික්කයේ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ කටයුතු කරමින් සිටි මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(ii) එම විවාහ රෙජිස්ට්‍රාර් කොට්ඨාස මඟින් ආවරණය වන ග්‍රාම නිලධාරි වසම් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම රෙජිස්ට්‍රාර් කොට්ඨාස ප්‍රකාශයට පත්කරන ලද ගැසට් පත්‍ර අංක හා නිවේදන සභාගත කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1953/'17

ගරු වාසුදේව නානායක්කාර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2007 වර්ෂයේදී සබරගමුව විශ්වවිද්‍යාලය සඳහා වෛද්‍ය පීඨයක් ආරම්භ කිරීමට යෝජනා කර, වර්ෂ 2010 දී රත්නපුර මහ රෝහලට සම්බන්ධකර උපාධි පාඨමාලා 3ක් යටතේ සිසුන් 125ක් බඳවාගැනීමට සැලසුම් සකස් කළ බව පිළිගන්නේද;

(ii) ඒ අනුව, වෛද්‍ය උපාධිය සඳහා සිසුන් 75ක් ද, හෙද උපාධිය සඳහා සිසුන් 25ක් සහ පරිපූරක වෛද්‍ය උපාධියට සිසුන් 25ක් ලෙස බඳවාගැනීමට නියමිතව තිබූ බව දන්නේද;

(iii) මේ සඳහා රත්නපුර මහ රෝහල අසල විශ්වවිද්‍යාලය සතුව අක්කර 21ක ඉඩමක්ද ඇති බව දන්නේද;

(iv) එම සැලසුම් සකස් කර වර්ෂ 7ක් ගතවී ඇතත්, මේ දක්වා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ආරම්භ කර නොමැති බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධව තීරණාත්මක සාකච්ඡාවක් රට තුළ ඇති වී තිබෙන මේ මොහොතේ වර්ෂ ගණනාවක් අතපසු වී ඇති සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය වහාම ආරම්භ කිරීමට පියවර ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1996/'17

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට 2014 සිට 2017 වර්ෂයේ ජුනි මස 30 දක්වා ලැබුණු පැමිණිලි සංඛ්‍යාව, වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2014 සිට 2017 ජුනි මස 30 දක්වා,

(i) විභාග කර අවසන් කර ඇති, විභාග කරමින් පවතින සහ විභාග කිරීම ආරම්භ නොකළ පැමිණිලි සංඛ්‍යාව;

(ii) අධිකරණයන්හි නඩු පවරා ඇති පැමිණිලි සංඛ්‍යාව;

(iii) නඩු පැවරීමට හෝ නීතිපති උපදෙස් සඳහා යොමුකර ඇති පැමිණිලි සංඛ්‍යාව;

(iv) මේ වනතෙක් නීතිපති උපදෙස් නොලැබුණු පැමිණිලි සංඛ්‍යාව;

(v) පවරා ඇති නඩුවලින් දේශපාලනඥයන් හා සම්බන්ධ නඩු සංඛ්‍යාව;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2074/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008 වර්ෂයේදී ත්‍රිකුණාමලය, කින්නියා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වට්ටමඩු හා තුවරංකුලම් ගම්මානවල පවුල් 15කට වැඩි සංඛ්‍යාවක් නැවත පදිංචි කරන ලද බවත්;

(ii) එතැන් පටන් මෙම ජනතාව නිවාස හෝ වෙනත් කිසිදු මූලික පහසුකමක් නොමැතිව, බොහෝ දුෂ්කරතාවයන්ට පත්ව සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ජනතාවට අවශ්‍ය නිවාස සහ වෙනත් මූලික පහසුකම් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2017 නොවැම්බර් මස 30 වැනි බ්‍රහස්පතින්දා
## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

688/'16

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනප්‍රිය පාසල් අතර පවත්වන වාර්ෂික මහා ක්‍රිකට් තරඟ සඳහා බියර් සමාගම් අනුග්‍රහය දක්වන බවත්;

(ii) එම තරඟ පැවැත්වෙන අතරතුර බියර් සමාගම් තම ප්‍රචාරක කටයුතු සිදු කරන බවත්;

(iii) මේ හරහා පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹෙන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) පාසල් අතර පවත්වනු ලබන වාර්ෂික මහා ක්‍රිකට් තරඟ සඳහා අනුග්‍රාහකයන් සොයා ගැනීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේද හා නිර්ණායක අමාත්‍යාංශය විසින් නිර්දේශ කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේද හා නිර්ණායක කවරේද;

(iii) නොඑසේ නම්, ඒ සඳහා ක්‍රමවේද හා නිර්ණායක නිර්දේශ කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රිකට් තරඟ ආශ්‍රිතව මත්ද්‍රව්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කිරීම නතර කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1982/'17

ගරු කනක හේරත් මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වසර දෙක තුළ පුහුණු කර ඇති ආධුනිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉදිකිරීම් සහ කාර්මික අංශය සඳහා පුහුණුව ලබාදී ඇති ආධුනිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ප්‍රමාණයෙන් රැකියාගත කර ඇති සංඛ්‍යාව කොපමණද;

(iv) පසුගිය වසර දෙක තුළ කාර්මික අංශයේ හා ඉදිකිරීම් අංශයේ පුහුණුව ලැබූ සංඛ්‍යාව ශ්‍රම බලකායේ ඉල්ලුමට ප්‍රමාණවත්ද;

(v) නොඑසේ නම්, බඳවා ගන්නා ආධුනිකයන් සංඛ්‍යාව වැඩි කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1999/'17

ගරු බිමල් රත්නායක මහතා,— කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමු සංවර්ධන අමාත්‍යවරයාගේ අමාත්‍ය කාර්යාලවල ලිපිනයන් කවරේද;

(ii) එම කාර්යාල වෙනුවෙන් කුලී හෝ බදු ගෙවන්නේ නම්, එම මාසික කුලී/බදු මුදල කොපමණද;

(iii) 2015 වර්ෂයේ සිට 2017 වර්ෂයේ මේ දක්වා ගෙවා ඇති මුළු කුලී/බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව;

(ii) එම පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

(iii) අමාත්‍යවරයා සඳහා වෙන්කර ඇති වාහන සංඛ්‍යාව;

එක් එක් අමාත්‍යාංශය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2075/'17

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය මහ නගර සභා බලප්‍රදේශය තුළ අපද්‍රව්‍ය බැහැර කිරීමේ ව්‍යාපෘතියක්, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශ වැඩසටහන් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබුණේද;

(ii) ඉහත ව්‍යාපෘතිය සඳහා සැලසුම් හා ව්‍යාපෘතියට අදාළ ටෙන්ඩර් කටයුතු සම්පාදනය කර තිබේද;

(iii) ඒ අනුව, මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් ලබාදීමට ප්‍රංශ ඒජන්සි ආයතනය ඉදිරිපත් වී සිටින්නේද;

(iv) මෙම ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2119/’17

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015.01.09 දිනට සහ 2017.06.30 දිනට,

(i) යාපනය දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර තිබූ ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව;

(ii) එම කඳවුරුවලට අනුයුක්තව සේවය කළ මුළු නිලධාරින් හා සෙබළුන් සංඛ්‍යාව;

(iii) එක් එක් කඳවුරෙහි නම, පිහිටා තිබූ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ අනුයුක්තව සිටි නිලධාරින් සහ සෙබළුන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2015.01.09 දින සිට 2017.06.30 දක්වා යාපනය දිස්ත්‍රික්කයෙන්,

(i) ඉවත් කර ඇති ගුවන් හමුදා කඳවුරු සංඛ්‍යාව;

(ii) ගුවන් හමුදා කඳවුරුවලින් ඉවත් කර ඇති නිලධාරින් හා සෙබළුන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) යාපනය දිස්ත්‍රික්කයෙන් ගුවන් හමුදා කඳවුරු හා ඒවායේ සේවයේ නියුතු නිලධාරින් හා සෙබළුන් ඉවත් කිරීම ජාතික ආරක්ෂාවට බලවත් තර්ජනයක් බව පිළිගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2124/’17

ගරු මයන්ත දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තෙත් කලාපයේ කුඹුරු පුරන්වීම ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනය අඩුවීමට මෙන්ම, පාරිසරික ගැටලුවකටද හේතු වී ඇති බව දන්නේද;

(ii) පුරන් කුඹුරු අස්වැද්දීම පිළිබඳව ක්‍රියාත්මකවන යෝජනා කවරේද;

(iii) වී වගාවෙන් ගොවියා ඉවත් වීමට බලපාන හේතු කවරේද;

(iv) ඒ සඳහා ලබාදෙන විසඳුම් කවරේද;

(v) කුඹුරු වගා කිරීමේ කාර්ය කරවීම සඳහා අමාත්‍යාංශය යටතේ ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින් සිටින නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(vi) එම නිලධාරින් කවුරුන්ද;

(vii) මෑතකදී ගමකට, කාන්තාවන් 20 බැගින් වූ ගොවි සංවිධානයක් පිහිටුවීම මඟින් පුරන් කුඹුරු වගා කිරීමේ කාර්යය ඉටුවන්නේද;

(viii) නව කෘෂිකාර්මික ප්‍රතිපත්තිය තුළ පුරන් කුඹුරු වගාකිරීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ix) ප්‍රාදේශීය මට්ටමේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති සාර්ථක කර ගැනීම සඳහා එක් ගොවිජන සංවර්ධන මධ්‍යස්ථානයකට උපාධිධාරින් සිව්දෙනා බැගින් බඳවා ගැනීමෙන් අපේක්ෂිත පරමාර්ථය ඉටු වී තිබේද;

(x) උපාධිධාරින් වෙත පවරා ඇති රාජකාරි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2126/'17

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ ගොවිජන බලප්‍රදේශයේ, ගිරිඋල්ල විහාරස්ථානයට අයත් ජම්බුගහමුලදෙනිය නැමති කුඹුර නිසි අවසරයකින් තොරව පුරවා පෞද්ගලික මාර්ගයක් ඉදිකර ඇති බවත්;

(ii) මේ සඳහා කුඨ ලේඛන සකස් කිරීමට රජයේ මුදල් වියදම් කර ඇති බවත්;

(iii) ඉහත මාර්ගය ඉදිකර ඇත්තේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහයකවරයෙකුගේ නිවසක් සඳහා ප්‍රවේශ මාර්ගයක් වශයෙන් බවත්;

(iv) ඉහත මාර්ගයේ ආරම්භක කොටසද අනවසර ලෙස ඉදිකර ඇති බවත්;

(v) මෙම ස්ථානයේ අඩිපාරක් හෝ නොතිබුනු බවත්; ප්‍රාදේශීය සභාවට අයත් නොවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මහජන මුදල් අවභාවිතා කරන මෙවැනි නිලධාරින් සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2168/'17

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 43 ප්‍රබෝධාගම ග්‍රාම නිලධාරී වසමේ, නාවක්කුලම ගම්මානයේ ගල් ඇඹරුම්හලක් ආරම්භ කිරීමට අවසර ලබා දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එසේ නම්,

(i) ගල් ඇඹරුම්හලේ බලපත්‍ර අංකය හා එය නිකුත් කළ දිනය;

(ii) අයදුම් කළ පුද්ගලයාගේ නම සහ අයදුම් කළ දිනය;

(iii) එම බලපත්‍රය නිකුත් කිරීමට පරිසර වාර්තාවක් ලබාගෙන තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ගල් ඇඹරුම්හල ආරම්භ කිරීමට පෙර ජනතා අදහස් විමසිල්ලට ලක් කර තිබේද;

(ii) එකී ඇඹරුම්හල සම්බන්ධයෙන් ජනතා විරෝධය පැන නැඟී ඇති බව දන්නේද;

(iii) මෙම ඇඹරුම්හල ආරම්භ කිරීමෙන් ප්‍රදේශයේ ජනතාවට සිදුවිය හැකි සෞඛ්‍ය හා පාරිසරික ගැටලු විසඳීමට කටයුතු කරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?